# 1. 1962 ආර්ථික ප්‍රශ්න සහ ප්‍රතිපත්ති

## හැඳින්වීම

1962 දී, ලංකාවේ දළ ජාතික නිෂ්පාදිතය, පවත්නා මිලට සැකසූ තාවකාලික ඇස්තමේන්තු අනුව, පසුගිය වසරට වඩා සියයට 4·1 කින් වැඩි වී ඇත. ස්ථාවර මිල අනුව, එනම් මූර්ත වශයෙන්, මේ වැඩිවීම සියයට 4·0 කි. ජනගහනය අවුරුද්දකට සියයට 2·7 කින් වැඩි වෙතැයි යන පදනම උඩ, බැලීමේ දී, එක් අයෙකුට වැටෙන මූර්ත නිෂ්පාදිතය වැඩිවී ඇත්තේ සියයට 1·3 කිනි. මුළු දේශීය නිෂ්පාදිතය, මූර්ත වශයෙන්, වැඩිවීමට, බොහෝ සෙයින් හේතු වී ඇත්තේ, විශේෂයෙන්, වී සහ මාළු ඇතුළුව, මෙරට ප්‍රයෝජනයට ගනු ලබන, නිෂ්පාදිත වැඩිවීමය. ජාතික නිෂ්පාදිතයට, කාර්මික අංශයෙන් මෙතෙක් එකතු වී ඇති කොටස සුළු වුවද, කාර්මික නිෂ්පාදන අංශයෙහි ද කාර්ය බහුල තාවක සාක්ෂි දිස්විය. 1961 දී සියයට 8·1 කින් වැඩි වූ, පිටරට පැටවුම සඳහා කැරුන බෝග නිෂ්පාදනය, 1962 දී වැඩි වී ඇත්තේ සියයට 3·2 කින් පමණෙකි.

මුදල් හා මූල්‍ය අංශයේ, ප්‍රාසාරණාත්මක බලපෑමක් ඇති කරමින් තිබෙන සාධකයන්ගේ සැලකියයුතු බාලවීමෙක් 1962 වසරේදී ද නොදක්නා ලදී. රජයේ අය–වැය ලේඛනයේ, මුළු අය-වැය හිඟය, මෙයට පෙරාතු අවුරුදු වල පැවැති පමණටම, නැගී ගත්තේය. 1961–62 මුදල් වසරේදී රජයේ අය–වැය හිඟය, රුපියල් කෝටි 45·7 ක් විය. මේ හිඟයෙන් රුපියල් කෝටි 19·0 ක්ම බැංකු වලින් ණය මවා ගැනීමෙන් පියවා ගන්නා ලදී. 1962–63 සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කැරුන අය–වැය ලේඛනයෙන්, මුළු අය–වැය හිඟය අඩු කිරීමටත්, හිඟය පියවීමේ දී ඇතිවන ප්‍රාසාරණාත්මක බලපෑම අඩු කිරීමටත්, බලාපොරොත්තු විය. එහෙත්, මේ පරමාර්ථය සඳහා සැකසුන යෝජනා දෙකක්, එනම්, සලාක ක්‍රමය යටතේ විකුණන සහල් ප්‍රමාණය අඩු කිරීමේ යෝජනාවත්, සමහර භාණ්ඩ වර්ග සඳහා අලෙවි බද්දක් පැනවීමේ යෝජනාවත්, පසුව ඉල්ලා අස් කර ගනු ලැබීය. මේ නිසා අවසානයේ පාර්ලිමේන්තුවෙන් සම්මත වූ අය–වැය ලේඛනයේ රුපියල් කෝටි 46·33 ක අය වැය–හිඟයක් දිස්වූ අතර, රුපියල් කෝටි 13·3 ක නොපියවුන හිඟයක් ද ඇතිවිය. තවද, සංශෝධිත ආදයම් හා වියදම් ඇස්තමේන්තු අනුව, මේ හිඟයන් තවත් වැඩි වෙතැයි ඇදහිය හැකිය.

මෙයට පෙර වසර වලදී, රජයේ අය–වැය ලේඛනයෙන් උද්ගත වූ ප්‍රාසාරණාත්මක බලපෑම හේතු කොට, ආනයන ඉල්ලුම වැඩිවිය. එසේම එහි ඵල විසින් ලංකාවේ විදේශීය වත්කම් ද අඩු වී ගියේය. පිටරට පටවන භාණ්ඩ මිල 1960 දී සිටම පහළ වැටීම නිසා, ලංකාවේ ගෙවුම් ශේෂය කෙරෙහි, ඇති වූ පීඩාව තවත් අධික විය. 1961 දී මෙරටට භාණ්ඩ ගෙන්වීම සලාක ක්‍රමයක් අනුව සීමා කරන ලදී. 1962 දී මේ සීමාවන් තවත් දැඩි කළේ, සමහර වර්ගවල අත්‍යාවශ්‍ය භාණ්ඩ හැර, අනෙක් සියලුම භාණ්ඩ වර්ග ගෙන්වීම සීමා කැරිණි. මෙසේ පිටරටින් බඩු ගෙන්වීම සීමා කිරීම නිසා විදේශීය වත්කම් පහළ වැටීම අඩුකර ගැනීමට හැකි විය. 1961 දී ලංකාවේ විදේශීය වත්කම් රුපියල් කෝටි 0·96 කින් පහළ වැටුන අතර, 1962 දී එය රුපියල් කෝටි 2·78 කින් පහළ වැටිණි. මේ දෙවසරේම ජාත්‍යන්තර, මුදල් මණ්ඩලයෙන් රුපියල් කෝටි 5·38 බැගින් ගනුලැබූ, විදේශීය විනිමය මෙයින් අඩු කළහොත්, වැය වී ගිය විදේශීය වත්කම් ප්‍රමාණය 1961 රුපියල් කෝටි 6·34 ක් සහ 1962 දී රුපියල් කෝටි 8·16 ක් වන්නට තිබිණ. මෙය 1958, 1959, 1960 පිළිවෙළින් අඩු වී ගිය විදේශීය විනිමය ප්‍රමාණයන් වන රුපියල් කෝටි 12·87, රුපියල් කෝටි 19·92 සහ රුපියල් කෝටි 19·27 හා සැසැඳෙන්නේය. 1962 මැද භාගයේදී පනවන ලද ආනයන සීමා කිරීම් වලින් ඇතිවූ ඵලය එම අවුරුද්දේ ගෙවුම් තත්ත්වයෙන් පිළිබිඹු නොවුනා විය හැකිය.

පිටරටින් බඩු ගෙන්වීම දැඩි ලෙස සීමා කිරීමත් සමගම, මුදල් ප්‍රාසාරණයේ බලපෑම මූලික වශයෙන්ම දේශීය මිල මට්ටම කෙරෙහි දැනෙන්නට වන්නේය. මුදල් ප්‍රාසාරණය අඩු නොකැරුන හොත්, හෝ, බඩු ගෙන්වීම සීමා කිරීම නිසා ඇතිවූ භාණ්ඩ හිඟය, මෙරට භාණ්ඩ

නිපදවා මකා නොගත හොත් හෝ, බඩු හිඟයත්, මිල අධිකයත්, තවත් වේගයෙන් වැඩිවිය හැකිය. මේ මිල අධිකය හා බඩු හිඟය, එක්තරා සීමාවක් තුළ රඳවා නොගතහොත් එය මුළු අර්ථ ක්‍රමය පුරාම පැතිරී යාමෙන් වැටුප් මට්ටම කෙරෙහි බලපෑමටත්, නිෂ්පාදන වියදම වැඩි වී යාමටත් හේතු වන්නේය. එසේම ලංකාවේ භාණ්ඩ වලට විදේශීය වෙළෙඳ පොළේ දී තරඟ කිරීමට ඇති හැකියාව, අඩාල වී යනවා පමණක් නොව, මිල වැඩි වීමත් සමග ආදායම් වැඩි නොවන ජන කොටස් වලට, දුෂ්කරතාවනට මුහුණ පෑමට ද සිදු වන්නේය. 1962 දී වර්තන ගිණුම් වල විදේශීය ගෙවුමෙහි දිගටම ඇතිවූ හිඟයත්, පිට රටින් ගෙන්වූ භාණ්ඩ තොග තිබීමත්, සමහර වර්ග වල ආහාර වර්ග සහ අනෙකුත් අත්‍යාවශ්‍ය භාණ්ඩ, ගෙන්වීම සීමා නොකිරීමත්, මෙරට නිෂ්පාදනය වැඩි වීමත්, යන හේතූන්, මිල ඉහළ යාම, වළක්වා ගැනීමට උදව් විය. පාලන මිලකට හෝ ආධාර ක්‍රමයට හෝ, සැපයෙන භාණ්ඩ වර්ග බොහෝ ගණනක් ඇතුළුවන කොළඹ පාරිභෝගිකයන්ගේ ජීවන වියදම් දර්ශකය, අවුරුද්ද තුළ සාමාන්‍ය වශයෙන් සියයට 1·4 කින් පමණක් වැඩි විය. මේ දර්ශකයෙන් පිට, භාණ්ඩ වර්ග කීපයකම, මිල සැලකිය යුතු අන්දමින් ඉහළ යාමෙන්, සාමාන්‍ය මිල මට්ටම ක්‍රමයෙන් ඉහළ යන බවක් කියාපායි.

ගෙවුම් ශේෂ අවශ්‍යතා නිසා, ආනයන සීමා කිරීමෙන් උද්ගත වූ තත්ත්වය හේතුකොට, දේශීය කාර්මික අංශයේ වර්ධනයෙහි, උනන්දුවක් ඇති විය. කාර්මික අංශයෙන්, දළ ජාතික නිෂ්පාදිතයට එකතු වූ ප්‍රමාණය තවමත් සුළු වුවද, 1962 රාජ්‍ය සහ පෞද්ගලික යන දෙ අංශයේම කාර්මික නිෂ්පාදන කටයුතු පුළුල් වී ගිය බවට සාක්ෂි ඇත්තේය. දිගු කාලීන වශයෙන් ආයෝජනය කිරීමෙන්, කර්මාන්ත අංශයේ මේ වැඩ පිළිවෙළ තව දුරටත් ගෙන ගියහොත්, ලංකාවේ අර්ථ ක්‍රමය කර්මාන්ත බහුල අර්ථ ක්‍රමයකට හැරවීමේ මූලික වෙනස්කම් වල ආරම්භය උදා විය හැක්කේය.

මේ වාර්තාවේ පළමුවැනි කොටසින්, ඉහත සඳහන් සමහර සාධක අනුව, ලංකාවේ අර්ථ ක්‍රමයෙහි හැඩගැස්ම පිළිබඳ සම්පූර්ණ විග්‍රහයක් ද, දෙවැනි කොටසින් ජාතික ආදායම සහ වියදම විදේශීය වෙළෙඳාම, මිල හා වැටුප්, මුදල් හා බැංකු කටයුතු, රජයේ මුදල්, ගෙවුම් ශේෂය, සහ කාර්මික සංවර්ධනය ගැන, තොරතුරු හා සැකැස්ම ගැන විස්තරාත්මක වාර්තාවක් ද ඉදිරිපත් කැරේ.

## (1) 1962 ආර්ථික වර්ධනය

ඉහත සඳහන් කර ඇති පරිදි, පවත්නා මිල අනුව සැකසූ තාවකාලික ඇස්තමේන්තු අනුව, 1962 දී ලංකාවේ දළ ජාතික නිෂ්පාදිතය, සියයට 4·1 කින් වැඩි වී ඇත. 1961 දී ඇති වූ සියයට 0·8 වැඩිවීම හා සසඳන විට, මෙය සෑහෙන ප්‍රමාණයක දියුණුවකි. එක් අයෙකුට වැටෙන දළ ජාතික නිෂ්පාදිතය 1962 දී සියයට 1·3 කින් වැඩි වී ඇත. මෙය 1961 දී සියයට 1·9 කින් පහළ වැටිණි.

මිල වෙනස්වීම් දක්වන නිරවද්‍ය සංඛ්‍යා තොරතුරු නොමැතිවීම නිසා, දළ ජාතික නිෂ්පාදනය මූර්ත වශයෙන් ඇස්තමේන්තු කිරීම, තරමක් අපහසුය. එහෙත්, ලැබී තිබෙන සංඛ්‍යා තොරතුරු අනුව, 1962 දී දළ ජාතික නිෂ්පාදිතයේ ඇති වී තිබෙන වර්ධනය සියයට 4·0 කැයි ඇස්තමේන්තු කොට ඇත. එක් අයෙකුට වැටෙන ප්‍රමාණයේ වැඩිවීම සියයට 1·3 කි. මෙය, 1961 දී ඇති වූ වර්ධනයට වඩා වැඩිය. 1961 දී දළ ජාතික නිෂ්පාදිතයේ මූර්ත වර්ධනය සියයට 2·6 ක් වූ අතර, එක් අයකුට වැටෙන ප්‍රමාණය වැඩි වී ඇත්තේ සියයට 0·2 කින් පමණෙකි. මේ කරුණ, 1962 දී අර්ථ ක්‍රමයේ ක්‍රියාකාරිත්වයෙහි එක්තරා දියුණුවක් ඇති වී තිබෙන බව කියාපායි. එහෙත් 1961–62 දෑවුරුද්ද තුළ එක් අයකුට වැටෙන මූර්ත දළ ජාතික නිෂ්පාදනයේ සාමාන්‍යය වැඩි වී ඇත්තේ සියයට 0·6 කින් පමණෙකි.

මූර්ත ජාතික නිෂ්පාදිතයේ මුළු වැඩිවීමට බොහෝ සෙයින් හේතු වී ඇත්තේ, දේශීය අංශයෙහි නිපැයුම වැඩිවීමයි. 1962 දී දේශීය අංශයෙහි නිපැයුම, සියයට 4·4 කින් වැඩි විය. විශේෂයෙන් වී සහ මාලු නිෂ්පාදනය සැලකිය යුතු ප්‍රමාණයකින් වැඩි වී ඇතැයි ඇස්තමේන්තු

කොට තිබේ. එසේම කාර්මික නිෂ්පාදනයන් හා රජයේ ව්‍යාපාර වලින් කැරුන නිර්මිතයන් ද වැඩි වී ඇත. අපනයන අංශයේ නිපැයුම, 1962 සියයට 3·2 කින් වැඩි විය. එහෙත් 1961 වැඩිවීම සියයට 8·1 ක්ව තිබිණි. 1962 දී පිටරට පැටවූ මුළු භාණ්ඩ ප්‍රමාණය 1962 කැරුන නිෂ්පාදන ප්‍රමාණයට වඩා වැඩි විය. තේ සම්බන්ධයෙන් මෙසේ වූයේ රැස්කර ගෙන තුබූ තොග අඩු කර ගැනීම නිසාය.

1962 දී ද, එයට පෙරාතු වසර වල දී මෙන් ම, පවත්නා මිල අනුව, ලංකාවේ දළ ජාතික නිෂ්පාදිතය, ලංකාවේ දළ දේශීය වියදමට වඩා අඩු විය. දළ දේශීය වියදම යනුවෙන් හඟින්නේ පාරිභෝජනයට හා ප්‍රාග්ධන සම්පාදනයට වැය වන මුළු මුදලයි. විදේශීය වත්කම් අඩුවීයාමෙන් හා පිටරට වගකීම් වැඩිවී යාමෙන්, මෙය පිළිබිඹු වෙයි. එහෙත්, 1961 දී සහ 1962 දී දළ ජාතික නිෂ්පාදිතය සහ පාරිභෝජනය හා ප්‍රාග්ධන සම්පාදනය අතර, පරතරය, 1959 සහ 1960 දී පැවැති පරතරයට වඩා සැලකිය යුතු ප්‍රමාණයකින් කුඩා වී ඇත.

1962 දී පවත්නා මිල අනුව, දළ ප්‍රාග්ධන සම්පාදනය, දළ ජාතික නිෂ්පාදිතයෙන් සියයට 13·6 ක් වී ඇත. එහෙත් 1961 දී දළ ප්‍රාග්ධන සම්පාදනය, දළ ජාතික නිෂ්පාදිතයෙන් සියයට 14·1 ක් ව තිබිණි. 1962 දී ජාතික නිෂ්පාදිතයෙන් දළ ප්‍රාග්ධන සම්පාදනයට, යෙදවූ කොටස අඩු වී යාමට බොහෝ සෙයින් හේතු වී ඇත්තේ තොග අඩු වී යාමය. දළ ප්‍රාග්ධන සම්පාදනයේ ස්ථාවර වත්කම්, 1962 දී සියයට 9·0 කින් වැඩි විය. මෙය 1961 දී සියයට 6·5 කින් පහළ වැටිණි. දළ ප්‍රාග්ධන සම්පාදනයේ ස්ථාවර වත්කම් කොටස 1961 දී දළ ජාතික නිෂ්පාදිතයෙන් සියයට 13·9 ක්වූ අතර, 1962 දී එය සියයට 14·8 තෙක් වැඩි විය.

ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනයේ ඇති වූ දියුණුව, ජාතික ගිණුම් වල වර්ග කොට ඇති රජයේ හා රජයේ ව්‍යාපාර වලද, පෞද්ගලික හා රජයේ සමායතන වල ද යන දෙ අංශයේම දක්නට ලැබිණි* මුලින් කී අංශයේ ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය සියයට 10·8 කින් වැඩි වී ඇති අතර, දෙ වැනි අංශයේ වැඩිවීම සියයට 8·0 ක් විය.

## (2) රජයේ මුදල් පරිහරණය හා මුදල් ප්‍රාසාරණය

රටේ අර්ථ ක්‍රමයෙහි මතුව ඇති, මුදල් හා මූල්‍ය අසමතුලිතතාවයට, ප්‍රධානතම හේතුව වී ඇත්තේ විශාල අයවැය ලේඛන හිඟයන් බවත්, මේ නිසා, විදේශීය වත්කම් පළමුවෙන් අඩු වන බවත්, දෙවැනිව පිටරටින් ගෙන් වන භාණ්ඩාදිය සීමා කිරීමත් සමග, දේශීය මිල මට්ටම වැඩි වී යාමෙන් උද්ධමනාත්මක බලපෑමක් ඇති වන බවත් මෑත වර්ෂ සඳහා නිකුත් කැරුන මහ බැංකු වාර්ෂික වාර්තාවලින් පෙන්නුම් කර දෙන ලදී. එසේ ම, මුලින් ඇස්තමේන්තු කැරුන අයවැය හිඟයට වඩා අවසානයේ දී ඇති වන හිඟය වෙනස් වී යන ස්වරූපයක් ගන්නා බව ද, 1961 වාර්ෂික වාර්තාවෙන් තවදුරටත් පෙන්නුම් කරන ලදි. මේ අනුව, පාර්ලිමේන්තුවෙන් මුල දී සම්මත වුන 1960–61 අයවැය ලේඛනයෙන්, මුළු අයවැය හිඟය රුපියල් කෝටි 34·0 කින් අඩු කිරීමටත්, ප්‍රාසාරණාත්මක මාර්ගයන්ගෙන් මුදල් ලැබ හිඟය පියවීම මුළුමනින්ම අත්හැර දැමීමටත්, බලාපොරොත්තු විය. එහෙත්, අවසානයේ දී අයවැය හිඟය රුපියල් කෝටි 49·76 ක් වූ අතර, හිඟය පියවීමට, රුපියල් කෝටි 23·39 ක්ම ප්‍රාසාරණ මාර්ගවලින් ලබා ගැනීමට සිදු විය. මුල් ඇස්තමේන්තු මෙසේ වෙනස්වී යාමට එක් අතකින් හේතු වී ඇත්තේ පරිපූරක වශයෙන් පසුව කැරුන වියදම වැඩිවීමය.. තව ද, මෙයට වැඩි වශයෙන් ම හේතු වී ඇත්තේ විශේෂයෙන් ම, අළුත් බදු වලින් ලැබෙන ආදායම් ඇතුළුව, බලාපොරොත්තු වූ ආදායම් අඩු වී යාමය.

1962 වසර සඳහා, මෙම වාර්තාවෙන් කැරෙන සමීක්ෂණයට 1961–62 මුදල් වර්ෂයෙන් කොටසක්ද, 1962–63 මුදල් වර්ෂයෙන් කොටසක් ද, ඇතුළත් වෙයි. එහෙත් අවසන් ඇස්තමේන්තු සංඛ්‍යා ලැබී ඇත්තේ 1961–62 වර්ෂය සම්බන්ධයෙන් පමණකි. 1962–63 වර්ෂයේ අයවැය සැකැස්ම පිළිබඳ ඉඟියක්, පාර්ලිමේන්තුවෙන් සම්මත වූ ඇස්තමේන්තුවලින් හා පසුව කළ සංශෝධනයන් අනුව සපයා ඇත. මේ සංඛ්‍යා තොරතුරු වලින් දැක්වෙන පරිදි, කලින්

*ජාතික නිෂ්පාදිත හා වියදම් විග්‍රහව බලන්න.

අවුරුදු වල දී මෙන් ම, රජයේ මුදල් ගනුදෙනු වලින් සෑහෙන ප්‍රමාණයක අයවැය හිඟයක් ද, තරමක් දුරට ප්‍රාසාරණාත්මක මාර්ගවලින් හිඟය පියවීමක් ද ඇතිවීමට පිළිවන් බවත් පෙනේ. මුල් ඇස්තමේන්තුවලින් බලාපොරොත්තු වූවාට වඩා, අවසාන ඇස්තමේන්තුවල සැලකිය යුතු වෙනසෙක් නැවත වරක් ඇති වන බව පෙනේ.

1962 මුදල් වර්ෂයේ අය–වැය ලේඛනය අවසාන වශයෙන් හැඩ ගැසී ගිය අයුරු, මේ වාර්තාවේ අන් තැනෙක සවිස්තරව දක්වා ඇත. එබැවින් මෙහිලා දැක්විය යුත්තේ එහි ප්‍රධාන ලක්ෂණයන්ගේ සාරාංශයක් පමණකි. පාර්ලිමේන්තුවෙන් මුල දී සම්මත වූ පරිදි, 1961–62 අයවැය ලේඛනයෙන්, දැක්වුන දළ අයවැය හිඟය රුපියල් කෝටි 32·94 ක් විය. මෙයින් රුපියල් කෝටි 20·0 ක් දේශීය ණය ගැනීම් වලින් ද, රුපියල් කෝටි 14·0 ක් විදේශීය ආධාර මගින් ද ලබා ගැනීමට ඇස්තමේන්තු කැරිණි. එසේ ම, ප්‍රාසාරණාත්මක මාර්ගවලින් මුදල් ලබා ගැනීමේ බලාපොරොත්තුවක් ද නොවිණි. එහෙත් අවසානයේ දී දළ අය–වැය හිඟය රුපියල් කෝටි 50·17 ක් වූ අතර, ශුද්ධ අයවැය හිඟය (නිදන් අරමුදල් දයක දීමනා හා රාජ්‍ය ණය බේරීම් අඩු කොට) රුපියල් කෝටි 45·69 ක් විය. හිඟය පියවීම සඳහා ප්‍රාසාරණාත්මක මාර්ග වලින් ලබා ගත් මුදල ද රුපියල් කෝටි 19·04 ක් විය. රජයේ මුළු වියදම මුල් ඇස්තමේන්තු වලට වඩා රුපියල් කෝටි 2·5 කින් වැඩි විය. බලාපොරොත්තු වූ මුළු ආදයම රුපියල් කෝටි 15·14 කින් ද, විදේශීය ආධාර රුපියල් කෝටි 7·09 කින් ද අඩු විය.

1960–61 දී ශුද්ධ අයවැය හිඟය හා හිඟය පිය වූ අන්දම, කලින් වර්ෂ සමග සසඳා පහත සටහනේ දක්වා ඇත.

සංඛ්‍යා සටහන I—1

## හිඟය පියවීම, 1958-59 සිට 1960-61 දක්වා

රුපියල් දශ ලක්ෂ

| | 1958/59 | 1959/60 | 1960/61 | 1961/62 (තාවකාලිකයි) |
|---|---|---|---|---|
| **1. බැංකු නොවන මාර්ගයන්ගෙන් හිඟය පියවීම (එකතුව) මෙයින්,** | **172·5** | **170·5** | **221·2** | **270·5** |
| (අ) පරිපාලන ණය ගැනීම් | 27·6 | 57·4 | 29·4 | 104·5 |
| (ආ) බැංකු නොවන මාර්ගයන්ගෙන් දේශීය ණය ගැනීම් | 111·9 | 86·5 | 165·2 | 107·8 |
| (ඇ) විදේශීය ණය හා දීමනා | 33·0 | 26·6 | 26·6 | 58·2 |
| **2. බැංකු වලින් දේශීය ණය ගැනීම්** | **179·3** | **241·1** | **241·1** | **226·6** |
| **3. රජයේ මුදල් ශේෂ යොද ගැනීමෙන්** | **61·7** | **6·0** | නැත | **—40·2** |
| **4. මුළු මුදල් හිඟය (ශුඩ)** | **413·4** | **417·5** | **462·5** | **456·9** |
| **5. එ.ජ. ප්‍රතිපාර්ශවීය ගිණුමේ වෙනස ගැලපීම** | **—52·5** | **4·0** | **— 7·5** | **4·0** |
| **6. අය-වැය ලේඛනයේ ශුඩ ප්‍රාසාරණාත්මක බලපෑම (2 + 3 + 5)** | **188·5** | **251·1** | **233·9** | **190·4** |

ඉහත සංඛ්‍යා සටහනෙන් දැක්වෙන පරිදි, 1961–62 ශුද්ධ අයවැය හිඟය කලින් වර්ෂවල පැවැති ප්‍රමාණයටම සමාන වෙයි. එහෙත් හිඟය පියවීම සඳහා ප්‍රාසාරණ මාර්ගවලින් ලබා ගත් ප්‍රමාණය තරමක් අඩු විය. 1960–61 දී රුපියල් කෝටි 23·4 ක් වූ මෙය 1961–62 දී රුපියල් කෝටි 19·0 තෙක් අඩු විය. මෙයට වැඩියක් ම හේතු වූයේ බැංකු නොවන මාර්ගයන් ගෙන් දේශීය ණය ගැනීම් වලට වඩා පරිපාලන ණය ගැනීම් වැඩිවීමය. බැංකු නොවන මාර්ග යන්ගෙන් ගත් දේශීය ණය කලින් වර්ෂයේ දීට වඩා අඩු විය. 1961–62 පරිපාලන ණය ගැනීම් රුපියල් කෝටි 10·45 ක් විය. මේ මගින් කලින් ලබා ගත් ප්‍රමාණය හා සලකන විට මෙය, විශේෂ වැඩිවීමකි. ප්‍රධාන වශයෙන් ම පරිපාලන ණය ලැබී ඇත්තේ මුදල් ඇණවුම් අරමුදල්

වලින් (රුපියල් කෝටි 1·79) ලං.ග.ම. යේ (රුපියල් කෝටි 2·2) හා අනෙකුත් රජයේ නියෝජ්‍යාත්වයන්ගේ වැය නොවූ (රුපියල් කෝටි 5·08) ශේෂ වලිනි. මේ අරමුදල් තිබීම නිසා රජයේ මුදල් ශේෂ වැඩි වී ගියෙන්, 1961–62 දී ප්‍රාසාරණාත්මක මාර්ග වලින් ලබා ගත් මුදල් අඩු විය. කෙසේ වුවද, මෙම අරමුදල් විටින් විට වෙනස් වන තාවකාලික තැන්පතු හා කාරක ශේෂ වෙයි. මෙම අරමුදල් නොතිබෙන්නට බැංකු වලින් ණය ගෙන හිඟය පියවීම නිසා ප්‍රාසාරණාත්මක බලපෑම වැඩි වන්නට තිබිණි.

ඉහත සඳහන් කළ පරිදි, 1961–62 බැංකු නොවන මාර්ගයන්ගෙන් ගත් දේශීය ණය අඩු විය. 11 වැනි කොටසේ කෙටියෙන් දක්වා ඇති හේතුන් අනුව, මුළු ඉතිරි කිරීම් ප්‍රමාණය අඩු වීමට වඩා ද්‍රවශීලී ස්වරූපයෙන් ඉතිරි කිරීම් තබා ගැනීමට බැංකු නොවන ආයෝජකයන් කැමැත්ත දක්වීම මෙයට හේතු වූවා විය හැකිය.

1961–62 අයවැය හිඟය පියවීම සඳහා විදේශීය ණය හා දීමනා වලින් එකතු වූ මුදල් රුපියල් කෝටි 5·82 ක් විය. මෙය මුල් අයවැය ඇස්තමේන්තුවෙන් (රුපියල් කෝටි 14·0) බලාපොරොත්තු වූවාට වඩා සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු වුව ද, කලින් වර්ෂවල දීට වඩා විදේශීය ණය ප්‍රයෝජන ගැනීමක් මෙයින් පිළිබිඹු වෙයි. නිදසුනක් වශයෙන්, 1959–60 හා 1960–61 දෙවසේ අයවැය පියවීම සඳහා විදේශීය ණය හා දීමනා වලින් ලැබුනේ රුපියල් කෝටි 2·66 ක් බැගිනි. මෙම මුදල් මාර්ගයන් නියමිත යෝජනාක්‍රමයනට හෝ වැඩ පිළිවෙළ කට අදළව විදේශයෙන් ලැබෙන හෙයින් ඒවායින් ප්‍රයෝජන එකී යෝජනාක්‍රම හා වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කිරීමේ නියම දියුණුව මත රඳා පවතී. පසුගිය කාලයේ දී මේවායේ ඇති වූ ප්‍රමාදයන් හා අඩුපාඩු හේතුකොට ගෙන, විදේශීය මුදල් ආධාර ඇස්තමේන්තු හා ලැබුණු නියම ප්‍රමාණයන් අතර වෙනස්කම් ඇති විය. 1961–62 මුදල් වර්ෂයේ දී නියම වශයෙන් වැය කැරුණු මුළු ප්‍රාග්ධන ප්‍රමාණය වැඩි විය. 1960–61 දී රුපියල් කෝටි 51·91 ක් වූ ප්‍රාග්ධන වියදම් (රජයේ නියෝජ්‍යාත්වයනට දෙන ලද ණය ඇතුළුව) 1961–62 දී රුපියල් කෝටි 59·6 තෙක් (තාවකාලික) රුපියල් කෝටි 7·69 කින් වැඩි විය. රජයේ නියෝජ්‍යාත්වයනට දෙන ලද ණය හැර, කැරුණු ප්‍රාග්ධන වියදම (මූර්ත වත්කම් අත්කර ගැනීම, නිර්මාණය හා පවත්වා ගෙන යෑම) 1960–61 රුපියල් කෝටි 47·19 ක් වූ අතර, 1961–62 වන විට රුපියල් කෝටි 4·11 කින් රුපියල් කෝටි 51·30 (තාවකාලිකයි) තෙක් වැඩි විය.

1961–62 අයවැය ලේඛනයෙහි ප්‍රාසාරණාත්මක බලපෑම බලාපොරොත්තු වූ ආදයම හා ලැබුණු නියම ආදයම අතර වෙනස පිළිබිඹු කළ අතර, 1962–63 අයවැය ලේඛනය පාර්ලිමේන්තුවෙන් අනුමත වූ පරිදි, රුපියල් කෝටි 46·33 ක දළ අයවැය හිඟයක් හා රුපියල් කෝටි 13·33 ක නොපියවූ හිඟයක් පෙන්නුම් කළේය. අධික අයවැය හිඟය අඩුකර ගැනීමේ මාර්ග වශයෙන් අයවැය කතාවේ දී ඉදිරිපත් කැරුණු යෝජනා දෙකක් පසුව ඉවත් කර ගන්නා ලදී. මෙයින් පළමුවැන්න, ආහාර ද්‍රව්‍ය හැර අනෙකුත් භාණ්ඩ වර්ග කීපයක් සඳහා අලෙවි බද්දක් පැනවීමය; දෙ වැන්න, ආධාර ක්‍රමයට එක් අයෙකුට ලැබෙන සහල් සලාකය රාත්තල කින් අඩු කිරීමය. අලෙවි බද්දෙන් රුපියල් කෝටි 9·0 ක් ලබා ගැනීමට ද, සහල් සලාකය කපාලීමෙන් රුපියල් කෝටි 2·55 ක් ඉතිරි කර ගැනීමට ද, ඇස්තමේන්තු කැරිණි. අලෙවි බද්ද වෙනුවට පිටරටින් ගෙන්වන භාණ්ඩ බොහෝවක් සඳහා පවත්නා තීරු බද්ද පොදු වේ සියයට 20 කින් වැඩි කැරිණි. මෙයින් ලැබෙතැයි ඇස්තමේන්තු කළ ආදයම රුපියල් කෝටි 5·0 ක් විය.

පාර්ලිමේන්තුවෙන් සම්මත වූ අයවැය ලේඛනයෙහි මුළු හිඟය වන රුපියල් කෝටි 46·33 පියවීම සඳහා, රුපියල් කෝටි 18·0ක් දේශීය ණය ගැනීම් වලින් ද, රුපියල් කෝටි 15ක් විදේශාධාර වලින් ද, ලබා ගැනීමට ඇස්තමේන්තු කැරිණි. ඉහත කී පරිදි, නොපියවුන හිඟය රුපියල් කෝටි 13·3ක් විය. මෙසේ වුවද, සංශොධිත ආදයම් හා වියදම් ඇස්තමේන්තු අනුව මුළු අයවැය හිඟය හා නොපියවූ හිඟය තවත් පුළුල් විය හැකිය. එසේ ම අතිරේක වියදම් නිසා රජයේ මුළු වියදම තවත් වැඩි විය හැකිය. අනෙක් අතට, ආනයන සීමා කිරීම් නිසා ආනයන බදු ආදයම් අඩුවීමෙන් මුළු ආදයම පහළ වැටීමට ද, බැරි නැත. එසේ ම අයවැය ලේඛනය

සම්මත වූවාට පසු මේ සාධක වල බලපෑම මකාලීම සඳහා ද, නොපියවුන හිඟය මුල් ඇස්තමේන්තු වේ මට්ටමට සීමා කිරීමේ අදහසින් ද, විධිවිධාන කීපයක් පනවන ලදී. මේ විධිවිධාන වලට වී නිපදවන්නන්ගෙන් සලාක සහල් කූපන් ආපසු ලබා ගැනීම, උම්බලකඩ ආධාරය ආපසු ගැනීම, ආනයන බලපත්‍ර වෙනුවෙන් සියයට 1ක ගාස්තුවක් අය කිරීම, පලාත් කීපයක සලාක සහල් වෙනුවට වී දීම හා කොළඹ සිට වැය වන ප්‍රවාහන වියදම් ඇතුළත් වනසේ රටේ සෑම තැනම සලාක සහල්, පිටි හා සීනි විකුණුම් මිල සංශොධනය කිරීම[1] ඇතුළත් විය. එහෙත් රුපියල් කෝටි 4·0ක ඉතිරි කිරීමක් බලාපොරොත්තුවෙන් පැන වූ වී නිපදවන්නන්ගේ සහල් කූපන් ආපසු ගැනීමේ විධිවිධානය පසුව අත්හිට වන ලදී[2]. විදේශීය ආධාර වලින් ලැබෙන ප්‍රමාණය ද නැවත වරක් අඩුවීමට ඉඩ තිබේ. විදේශීය ආධාර පනත යටතේ, එක්සත් ජනපදයෙන් ලැබෙන ආධාර අත්හිටවීම් නිසා, රුපියල් කෝටි 0·38ක බලපෑමක් 1962–63 අයවැය ලේඛනය කෙරෙහි ඇති වන්නේය. එසේම ප්‍රාග්ධන යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමේදී ඇති වන ප්‍රමාද හා වෙනත් කරුණු නිසා අඩුවෙන් මුදල් වැය කිරීම හේතු කොට කලින් අවුරුදු වලදී මෙන් ම, විදේශීය ආධාර ප්‍රයෝජන ගැනීම කෙරෙහි ද බල පෑ හැකිය. එහෙත්, අඩුවෙන් මුදල් වැය කිරීම නිසා ඇති වන බලපෑම් පමණට වැය පක්ෂයෙන්ද, ඉතිරියක් වන හෙයින්, හුදෙක් විදේශීය ආධාර මුදල් ප්‍රමාණය අඩුවීම අයවැය පරතරය පුළුල් කිරීමට හේතු නොවේ.

1962- 63 මුදල් වර්ෂයේ දී මේ සඳහා පැන වූ වෙනත් විධිවිධාන නොමැති වූ බැවින්, නොපියවුන හිඟය පියවීම් වස් බැංකු වලින් ප්‍රමාණවත් ලෙස ණය ගැනීමට සිදු විය හැකිය. බැංකු වලින් ණය ගෙන අය වැය හිඟය පියවීම මුදල් සැපයුම කෙරෙහි ප්‍රාසාරණාත්මක බලපෑමක් ඇතිවීමට හේතු වෙයි. එම ණය මැදිකාලීන හා දිගුකාලීන රජයේ සුරකුම්පත් මගින් ද, භාණ්ඩාගාර බිල්පත් මගින් හා මහ බැංකු අත්තිකාරම් වශයෙන් ද ලබා ගත හැකිය. මේ ණයවලට වෙළෙඳ බැංකු හා මහබැංකු ණය ඇතුළත් වෙයි. කෙසේ වුවද, මුදල් නීති පනතට අනුව මහබැංකුව විසින් රජයට දිය හැකි ණය ප්‍රමාණය ඒ වර්ෂයේ දී ඇස්තමේන්තු කැරුන රජයේ ආදයමෙන් සියයට 10කට සීමා වෙයි. තව ද, රජයෙන් නිකුත් කැරෙන දිගු කාලීන හා මැදි කාලීන සුරකුම් පත් වලට මහ බැංකුව දයක නොවිය යුතු යැයි මුදල් නීති පනත විශේෂයෙන් සඳහන් කරයි. එබැවින් මහ බැංකුව රජයට ණය දෙනුයේ අත්තිකාරම් හා භාණ්ඩාගාර බිල්පත් මගිනි. වෙළෙඳ බැංකුවලට දිගු කාලීන හෝ මැදි කාලීන හෝ සුරකුම්පත් හා භාණ්ඩාගාර බිල්පත් මගින්, රජයට ණය දිය හැකිය.

වෙළෙඳ බැංකුවලින් වේවා මහ බැංකුවෙන් වේවා, රජය අය වැය හිඟය පියවීම සඳහා ණය ගන්නේ නම්, එය මුදල් සැපයුම කෙරෙහි ප්‍රාසාරණාත්මක බලපෑමකට හේතු වෙයි. කෙසේ වුවද, මෑත කාලයේ දී ලංකාවේ විදේශීය ගෙවුම් ශේෂ හිඟය අඩුවීමෙන්, බැංකු ද්‍රවශීල වත්කම් වැඩි වූවාට පසු රජයට දුන් වෙළෙඳ බැංකු ණය වැඩි වුවද, ඊට පෙර වෙළෙඳ බැංකු ණය එතරම් විශාල වූයේ නොවේ. එම නිසා හිඟය පියවීම සඳහා බැංකු ක්‍රමයෙන් ගත් ණය ප්‍රධාන වශයෙන් ම ගෙන ඇත්තේ මහ බැංකුවෙනි. රජයට ණය දෙන ප්‍රධාන මාධ්‍යය වී ඇත්තේ භාණ්ඩාගාර බිල්පත්ය.

භාණ්ඩාගාර බිල්පත් මාර්ගයෙන් ගත හැකි උපරිම ණය ප්‍රමාණය සීමා කොට ඇත. එය වැඩි කළ හැක්කේ පාර්ලිමේන්තු සම්මුතියකින් පමණෙකි. මෑත වර්ෂවල දී, බැංකු නොවන මාර්ගයන්ගෙන් ණය ගෙන පියවිය නොහැකි තරමට අයවැය හිඟයන් ඇති වූ බැවින්, භාණ්ඩාගාර බිල්පත්වල උපරිම සීමාව කෙමෙන් වැඩිකිරීමේ අවශ්‍යතාවය පැන නැඟිණි. මේ අනුව 1959 –60 මුදල් වර්ෂයේ දී, පාර්ලිමේන්තුව විසින් අනුදත් භාණ්ඩාගාර බිල්පත් සීමාව දෙවරක් වැඩි කැරිණි. මෙය 1959 ඔක්තෝබර් මාසයේ දී රුපියල් කෝටි 45·0 තෙක් ද, 1960 අගෝස්තු මාසයේ දී රුපියල් කෝටි 65·0 තෙක් ද වැඩි කැරිණි. 1960–61 මුදල් වර්ෂයේ, 1961 ජූනි

---

(1) ගරු මුදල් ඇමතිවරයා විසින් 1963 පෙබරවාරි 21 වැනි දින පාර්ලිමේන්තුවේ දී කළ ප්‍රකාශය

(2) වාණිජ, වෙළඳ, ආහාර හා නැව් කටයුතු පිළිබඳ ගරු ඇමතිවරයා විසින් 1963 මාර්තු 8 වැනි දින පාර්ලිමේන්තුවේ දී කළ ප්‍රකාශය

මාසයේ දී අනු දත් සීමාව, රුපියල් කෝටි 65·0 සිට රුපියල් කෝටි 75·0 තෙක් ද, 1961–62 මුදල් වර්ෂයේ දී රුපියල් කෝටි 100·0 තෙක්ද, 1962–63 මුදල් වර්ෂයේ, 1963 මාර්තු මාසයේ දී රුපියල් කෝටි 115·0 තෙක් ද, වැඩි කැරිණි. අනුදත් සීමාවන්හි වැඩිවීමට සමානව නොබේරා ඇති භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය ද ඉහළ ගියේය. මේ අනුව, 1959 අවසානයේ දී රුපියල් කෝටි 42·0 ක් වූ නොබේරූ මුළු භාණ්ඩාගාර බිල්පත් 1960 අවසානයේ දී රුපියල් කෝටි 62·5 තෙක් වැඩි විය. 1961 අවසානයේ දී මෙය රුපියල් කෝටි 77·5 ක් වූයේ 1962 අවසානය වන විට රුපියල් කෝටි 100·0 තෙක් වැඩි විය. මේ අතර මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය 1959, 1960, 1961 සහ 1962 යන වර්ෂාවසානයන්හි දී පිළිවෙලින් රුපියල් කෝටි 32·36 ක්, රුපියල් කෝටි 55·04 ක්, රුපියල් කෝටි 69·36 ක් හා රුපියල් කෝටි 87·24 ක් විය.

බැංකු ක්‍රමයෙන් ණය ගැනීම සඳහා භාණ්ඩාගාර බිල්පත් යොදවා ගැනීම, නොපියවුන අය–වැය හිඟය හා සම්බන්ධව පවත්නේ ය. රජයේ වියදමට වඩා, රජයට ලැබෙන ආදයම් අඩු වන විට, රජයේ මුදල් අවශ්‍යතා පිරිමසා ගැනීම සඳහා භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීමත්, ඒ මගින් මහ බැංකුවෙන් ණය ගැනීමත් හැර, රජයේ වියදම් පිරිමසා ගත හැකි වෙනත් මාර්ග යක් නොමැත. අය වැය පරතරය අඩු කිරීම හෝ බැංකු නොවන මාර්ගයන්ගෙන් ණය හෝ වෙනත් ලැබීම් වැඩි කිරීම සඳහා හෝ ගත හැකි පියවරක් නොමැති නම්, එවැනි ප්‍රාසාරණ මාර්ගවල පිහිට සෙවීම හැර කළ හැකි වෙන දෙයක් නැත. ගෙවුම් හා වියදම් සම්බන්ධ-යෙන් රජයේ වගකීම් ඉටුකළ හැක්කේ මේ අන්දමින් ණය ගැනීමෙනි. භාණ්ඩාගාර බිල්පත් මගින් හෝ වෙනත් ණය පත් මගින් හෝ ප්‍රාසාරණාත්මක ක්‍රමයට බැංකුවලින් හිඟය පියවීම සඳහා කෙතරම් ප්‍රමාණයක ණයක් ලබා ගැනීම අර්ථ ක්‍රමයට හිතවාදී වේද, නොමැති නම් අවශ්‍ය වේ ද, යන්න කිව හැක්කේ ආර්ථික වර්ධනයට කෙතරම් මුදලක් අවශ්‍ය වේද, යන්න තක්සේරු කිරීමෙනි. එසේ ම මිල ස්ථායිකිරීමේ ප්‍රතිපත්තිය අනුව ද සැලකීමෙනි. මෙරට නිපදවා හෝ පිටරටින් ගෙන්වා හෝ තිබෙන භාණ්ඩ ප්‍රමාණයට වඩා ප්‍රාසාරණාත්මක මගින් ගත් මුදල් අර්ථ ක්‍රමයට යෙදවීමේ ප්‍රතිඵලය වනුයේ මිල මට්ටම ඉහළ යාමය. කරදර ඇති වුවද, භාණ්ඩාගාර බිල්පත් මගින් මුදල් ලබා ගැනීම වැලැක්වීම සඳහා අධික අයවැය ලේඛන හිඟයන් අඩුකර ගැනීමේ අවශ්‍යතාව ගැන මහ බැංකුව පුන පුනාම කියා සිටින ලද්දේ මේ හේතුව නිසාය.

අලෙවි බද්ද, සහල් සලාකය අඩුකිරීම, හා වී වගාකරන්නන්ගේ සහල් කූපන් ආපසු ගැනීම වැනි 1962–63 අයවැය ලේඛනයෙන් ඉදිරිපත් කළ ප්‍රධාන අයවැය යෝජනා අස්කර ගැනීමට සිදුවීමෙන් අයවැය හිඟය හා ප්‍රාසාරණාත්මක මාර්ගවලින් මුදල් ගැනීම අඩුකිරීමේ දී මුහුණ පෑමට සිදු වන දුෂ්කරතා අත්දකින ලදි. එසේ වුවද, විදේශාධාර වැඩි නොවන විට, හා බැංකු නොවන මාර්ගයන්ගෙන් ඉතා අධික ලෙස ණය ගෙන තිබිය දී (මේවායින් ලැබෙන මුදල් ප්‍රමාණයන් ද සීමාවනට යටත්ය.) රජයේ ආදයම වැඩි කිරීම හෝ වියදම අඩු කිරීම හෝ හැර ප්‍රාසාරණාත්මකව ගනු ලබන මුදල් අඩු කළ හැකි අන් මගෙක් නොමැත. මෑත වර්ෂ වල දී ඇති වූ අයවැය හිඟයනට හේතු වූයේ රජයේ ආදයම අඩුවීම නොවේ. ඒ වෙනුවට, මුල් ඇස්තමේන්තු වලට වඩා තරමක් අඩු වුවද, රජයේ ආදයම, 1958–59 වර්ෂයේ සිට සෑම වසරක දීම කෙමෙන් වැඩි වී ඇති බව දක්ක හැකිය. මේ අනුව රජයේ වාර්ෂික ආදයම වැඩිවීම 1959–60 දී රුපියල් කෝටි 7·34 ක් ද, 1960–61 දී රුපියල් කෝටි 11·01 ක් ද, 1961–62 දී රුපියල් කෝටි 11·14 ක් ද විය. අයවැය හිඟය කපා හැරීමේ නියම බාධකය වූයේ රජයේ වියදම අයට වඩා වැඩි වේගයකින් ඉහළ යාමය. මෑත වර්ෂවලදී රජයේ වර්තන හා ප්‍රාග්ධන වියදම් වැඩිවී ඇත. එහෙත් මුළු වියදමෙන් වැඩි කොටසක් අයත් වූයේ වර්තන වියදම් වලටය. 1958–59 හා 1961–62 අතර කාලය තුළ දී රජයේ මුළු වියදම රුපියල් කෝටි 33·84 කින් වැඩි විය. මෙයින් රුපියල් කෝටි 22·56 ක් හෙවත් සියයට 66·7 ක් ම වර්තන වියදම් සඳහා යෙදවිණි. ප්‍රාග්ධන වියදම් සඳහා යෙදවුනේ රුපියල් කෝටි 11·28 ක් හෙවත් සියයට 33·3 ක් පමණෙකි.

අයවැය හිඟය අඩු කිරීමේ අටියෙන් ප්‍රාග්ධන වියදම කපා හැරීම ලංකාවේ කළ යුත්තක් හෝ ගැලපෙන්නක් හෝ නොවේ. ප්‍රාග්ධන වැඩ පිළිවෙළෙහි, යම්කිසි වෙනසෙක් ඇති කිරී

මෙන් යම්කිසි මුදලක් ඉතිරි කර ගත හැකිය. එහෙත් ආර්ථික සංවර්ධනය යුහුව ඇති කිරීමෙහි ලා අවශ්‍ය වනුයේ යොදවන මුළු ප්‍රාග්ධනය වැඩි කිරීමය. මෙයින් අදහස් වනුයේ අයවැය හිඟය අඩුකිරීමේ බර, ආදායම් හා වර්තන වියදම් කෙරෙහි පැටවෙන බවය.

ඉහත සඳහන් කළ පරිදි, පසුගිය වර්ෂවලදී ලංකාවේ ආදායම වැඩි කිරීමට ගත් උත්සාහයන් සඵල වී ඇත. බදු මාර්ගයෙන් ආදායම වැඩි කර ගැනීමට බලවත් උත්සාහයක් දරා ඇති අතර, හැම අයවැය ලේඛනයකින් ම බදු වැඩි කරන ලදි. ජාතික ආදායමට, රජයේ ආදායමේ ඇති සියයට ගණන වැඩි වීමෙන්, රජය මුදල් ලබා ගන්නා මාර්ග සාර්ථක අන්දමින් ප්‍රයෝජනයට ගෙන ඇති බව හෙළි වෙයි. 1951 දී සියයට 20·5 ක් වූ මෙය 1962 දී සියයට 25·7 තෙක් වැඩි විය. මෙයට පෙර, ජාතික ආදායමට, රජයේ ආදායමෙහි ඇති සියයට ගණන, පිටරට පටවන භාණ්ඩ මිල වැඩි වූ වකවානුවල වැඩි වූ අතර, මිල අඩු වූ විට අඩු විය. මෙයින් අපනයන අංශයේ ඇති වන උච්චාවචනය බදු ක්‍රමය කෙරෙහි කිට්ටු බලපෑමක් ඇති බව පිළිබිඹු කරයි. අපනයන මිල අවාසි සහගත වුන ද, ජාතික ආදායමට රජයේ ආදායමෙහි පැවැති සියයට ගණන ඉහළ මට්ටමක පවතී. මෙයට ප්‍රධාන හේතුව වී ඇත්තේ අවක්‍ර හා වක්‍ර බදු ප්‍රමාණයන් වැඩිවීමය. අවක්‍ර බදු අංශයෙහි බදු ප්‍රමාණයන් වැඩිවීමට අමතරව 1958 වර්ෂයේ සිට පැන වූ අළුත් බදු ගණනාවෙක් විය. 1962–63 වර්ෂයේ දී බදු ක්‍රමය ඒකාබද්ධ කොට, ආදායමට වැඩි බලපෑමෙක් නොවන සේ, බදු වර්ග අඩු කැරිණි. වක්‍ර බදු අතරින් ආනයන බදු සැලකිය යුතු ලෙස වැඩි විය සියළු ආනයනවල මි.ර.ගැ. වටිනාකමට ආනයන බදු වලින් ලැබුන ආදායමේ (ආනයන බදු සියල්ල පොදුවේ සලකන කල) එකතුවෙහි වූ සියයට ගණන 1953 දී සියයට 16 ක් වූ අතර, 1962 දී සියයට 28 තෙක් ඉහළ ගොස් තිබිණි. මුළු ආනයන ප්‍රමාණයට (ආහාර වර්ග හැර) මුළු ආනයන බදු වල එකතුවේ සියයට ගණන මේ කාලය තුළ දී සියයට 30·5 සිට 44·5 තෙක් වැඩිවිය.

සීමිත බදු පදනමක් උඩ, අවක්‍ර බදු මගින් ආදායම් වැඩි කර ගැනීමේ ඇති අපහසුව, 1961 මහ බැංකු වාර්ෂික වාර්තාවෙන් පෙන්වා දෙන ලදී. මේ අංශයේ ආදායම් ඉඩකඩ සහමුලින් ම වැඩට ගෙන ඇති නිසා අලුත් බදු වලින් ලැබෙන අමතර ආදායම අඩුවෙයි. එසේ ම රාජ්‍ය අංශ යෙන් පිටත ආයෝජනය සඳහා ඇති ධන මාර්ග හා උනන්දුවද අඩු වෙයි. බදු සහනදායක නීති පැනවීමෙන්, පසුව කී ප්‍රශ්නය තරමක් දුරට විසඳා ගත හැකි වුවද, රජයට අතිරේක ආදායම් ලබා ගැනීමේ ප්‍රශ්නය නොවිසඳෙයි. බදු පදනම පුළුල් නොකොට, අවක්‍ර බදු මගින් හෝ අලෙවි බද්ද හා ආනයන බදු වැනි වක්‍ර බදු මගින් හෝ මෙම අරමුණ ඉටු කර ගත හැක්කේ නොවේ.

අය පක්ෂය සීමා වනවිට, අයවැය පැනය විසඳනු සඳහා වර්තන වියදම් අඩුකළ යුතුය. ලංකාවේ ජාතික ආදායමෙන් සියයට 26 ක් ආදායමට යොදවා තිබියදීත් රාජ්‍ය හා පෞද්ගලික අංශයන් ගෙන් කැරෙන දළ ප්‍රාග්ධන සම්පාදනය, දළ ජාතික ආදායමෙන් සියයට 14 ක් පමණ වෙයි. වර්තන වියදම් සඳහා රජයේ සම්පත් මාර්ගවලින් වැය වන පමණ මෙයින් පිළිබිඹු වෙයි. මුළු වර්තන වියදම් අඩු කිරීමේදී ද, බලවත් දුෂ්කරතාවයනට මුහුණ පාන්නට සිදු වෙයි. සංවර්ධන සේවා, පාලන අවශ්‍යතා, හා සීඝ්‍රයෙන් වැඩි වන ජනගහනයේ තරමට සමාජ සේවා පහසුකම් සඳහා, අවශ්‍ය මුළු වර්තන වියදම් ප්‍රමාණය නොකඩවා වැඩි වෙයි. මෙයට අමතරව ආහාර ආධාර ද වෙයි. ආහාර ආධාරය 1961–62 දී රුපියල් කෝටි 23·54 ක් වූ අතර, රජයේ මුළු වර්තන වියදමෙන් සියයට 14·8 ක් විය. සීනිවලින් ලැබෙන ලාභය අඩු කොට නිපදවන්නාට හා පාරි භෝගිකයාට සහල් සඳහා දෙන ආධාරය රුපියල් කෝටි 38·22 ක් විය. ලංකාවේ සහල් නිපදවීම වැඩි කිරීමට ගනු ලබන උත්සාහය සඵල වීමත් සමගම ගැනුම් හා විකුණුම් මිල ප්‍රමාණයන් අනුව, සහල් ආධාරය සඳහා රජය ඉසිලිය යුතු බර ද, එන්ට එන්ටම වැඩි විය හැකිය. මෙය පරස්පර විරෝධී සිදුවීමකි. තව ද, ජනගහනය හා ආදායම වැඩිවීමත් සමග, ආහාරයට ගනු ලබන සහල් ප්‍රමාණය වැඩිවීමෙන්, සහල් ආධාරයට යන වියදම ද වැඩි වන්නේය.

අයවැය හිඟය අඩු කිරීමේ මාර්ගයක් වශයෙන්, නිපදවන්නාට හෝ පාරිභෝගිකයාට හෝ දෙන ආහාර ආධාරය අඩු කිරීමෙන්, එය පොදු ජනතාව කෙරෙහි හෝ යටත් පිරිසෙයින් ඉන් කොටසක් කෙරෙහි හෝ බලපාන්නේය. එහෙත් අවාසනාවකට මෙන්, ඒ වෙනුවට දිගින් දිගටම, අධික අයවැය හිඟයක් පවත්වා ගෙන යෑමෙන් ද, ජීවන වියදම හා මිල මට්ටම ඉහළ යාම නිසා, වඩා දරුණු උද්ධමනයක් ඇති වී හිරිහැර විඳීමට ද සිදු විය හැකිය. එවැන්න ක්

සාර්ථක ලෙස මැඩ නොපැවැත්වුවහොත් සාමාජික හා ආර්ථික අතින් ඇති වන අනිටු විපාක නිසා යථා තත්ත්වයට ගෙන ඒමේ හා ස්ථායිකරණයේ අවසන් පරිශ්‍රමය ද වඩා දුෂ්කර විය හැකිය. එබැවින්, ගැටළු පැන නැගුන ද ලංකාව අද මුහුණ පා තිබෙන තත්ත්වයේ හැටියට ප්‍රාසාරණාත්මක මාර්ගවලින් මුදල් පියවීම අඩු කිරීම ඉතා අවශ්‍යය. වර්ධනය වී යන අර්ථ ක්‍රමයකට සාමාන්‍ය මුදල් ප්‍රාසාරණයක් අවශ්‍ය විය හැකිය. එහෙත් රජයේ අයවැය ලේඛන මාර්ගයෙන් ඇති වන අධික මුදල් ප්‍රාසාරණය නියතයෙන්ම අඩු කර ගත යුත්තේය.

## (3) මුදල් ප්‍රාසාරණයේ බලපෑම

### (අ) විදේශීය ශේෂ

ඉහත පැහැදිලි කැරුන පරිදි, රජයේ අයවැය ලේඛනයෙන් උද්ගත වූ ප්‍රතිඵල අතර, ප්‍රධාන තැනක් ගනු ලැබූයේ, අර්ථ ක්‍රමයෙහි මුදල් සඳහා දිගටම අධික ඉල්ලුමක් ඇති වීමත් පිටරට භාණ්ඩ ගෙන්වීම සඳහා අධික බලපෑමක් ඇති වීමත්ය. එහෙත් 1960 වන විට විදේශීය වත්කම්, වේගයෙන් අඩුවී යාම නිසා පිටරටින් ගෙන්වන භාණ්ඩාදිය, අඩුකර ලීම සඳහා කෙලින්ම විධිවිධාන යෙදීමට අවශ්‍ය විය. මේ විධිවිධාන වලට, ගෙන්වන භාණ්ඩ ප්‍රමාණය සලාක ක්‍රමයක් අනුව සීමා කිරීම හා බලපත්‍ර නිකුත් කොට සීමා කිරීම ද, අධික තීරුබදු පැන වීමෙන් සීමා කිරීම ද, අයත් විය.

1960 අගෝස්තු මාසයේදී බඩු ගෙන්වීම සලාක වශයෙන් සීමා කිරීමේ විධිවිධාන සමහරක් පනවන ලදී. 1961 ජනවාරි මාසයේදී මේ විධිවිධාන තවත් පුළුල් කරනු ලැබීය. 1962 දී ද ප්‍රාසාරණාත්මක බලපෑම දිගටම පැවැති නිසාත්, පිටරට යවන භාණ්ඩාදියට ලැබුන මිලෙහි, සැලකිය යුතු දියුණුවක් ඇති නොවුන නිසාත්, 1962 දී භාණ්ඩ ගෙන්වීම සීමාකොට පැනවූ විධිවිධාන තවදුරටත්, ශක්තිමත් කිරීමට සිදුවිය. 1962 පෙබරවාරි, ජූලි සහ සැප්තැම්බර් යන මාස වල දී, පෞද්ගලික බලපත්‍ර යටතට ගනු ලැබූ භාණ්ඩ වර්ග ක්‍රමයෙන් වැඩි කරන ලදී. මෙයින් පසු 1962 ඔක්තෝබර් 10 වැනි දින අත්‍යාවශ්‍ය භාණ්ඩ වර්ග පහක් හැර, අනෙක් සියළුම භාණ්ඩ පෞද්ගලික බලපත්‍ර යටතට ගැනීමට තීරණය කැරිණි. බලපත්‍ර වලින් නිදහස් කැරුණ වර්ග වලට, (i) ආහාර, (ii) ඛනිජතෙල්, (iii) ඉන්ධන, (iv) පොහොර, (v) ලංකා රෝහල් විධි ග්‍රන්ථයෙහි සඳහන් බෙහෙත් වර්ග අයත් විය.

1962 ආරම්භයේ පෞද්ගලික බලපත්‍ර යටතට ගත් භාණ්ඩ, 1961 දී ලංකාවට ගෙන්වූ මුළු භාණ්ඩ ප්‍රමාණයෙන් සියයට 17 ක් හෝ රුපියල් කෝටි 28·7 ක් හෝ, නියෝජනය කැරිණි. 1962 පෙබරවාරි, ජූලි සහ සැප්තැම්බර් මාස වලදී මේ සීමාවන් පුළුල් කැරුනේ, 1961 ලංකාවට ගෙන්වූ මුළු භාණ්ඩ වලින් සියයට 30 ක් හෝ රුපියල් කෝටි 50·5 ක් හෝ, ඉන් නියෝජනය විය. ඔක්තෝබර් මාසයේදී මේ සීමාවන් තවත් පුළුල් කැරුනේ, 1961 මුළු ආනයනයෙන්, සියයට 48 ක් හෝ, රුපියල් කෝටි 81·1 ක් ඉන් නියෝජනය විය. මේ සංඛ්‍යා වලින් දැක් වෙන්නේ බලපත්‍ර ක්‍රමය යටතට ගත් ප්‍රමාණය පමණෙකි. නියම වශයෙන්ම ආනයන සීමාවේ බලපෑම රැඳී පවත්නේ ද, සලාක අනුව ගෙන්වීමට ඉඩ දී ඇති නියමිත ප්‍රමාණය අනුවය. නිල ඇස්තමේන්තු අනුව, 1962 ඔක්තෝබර්, සැප්තැම්බර් සහ ජූලි වලදී පනවන ලද සීමා කිරීම්වල සම්පූර්ණ බලපෑම ඇතිවූ විට, 1961 ආනයන ප්‍රමාණය අනුව, රුපියල් කෝටි 10 ක ඉතිරිවීමෙක් ඇති වෙතැයි සැලකේ.

රේගුවෙන් ලැබී ඇති සංඛ්‍යා අනුව 1961 ප්‍රමාණය අනුව 1962 දී ආනයන නියම වශයෙන් අඩු වී ඇත්තේ රුපියල් කෝටි 4·3 කින් පමණෙකි. එහෙත් 1961 භාණ්ඩ ගෙන්වීම, 1960 ගෙන් වූ ප්‍රමාණයට වඩා රුපියල් කෝටි 25·7 කින් අඩු වී ඇත. 1962 දී පිටරටින් ගෙන්වූ භාණ්ඩ වල වටිනාකම සුළු වශයෙන් අඩුවීමට හේතු වී ඇත්තේ, එක් අතකින් 1962 වසර තුළදී පනවන ලද සීමා කිරීම් වල සම්පූර්ණ බලපෑම එතෙක් ඇති නොවීම නිසා විය හැකිය. අනෙක් අතට, පසුගිය වසරේ භාණ්ඩ බොහෝ සෙයින් ගෙන්වීම නතර කර ගැනීම නිසා විය හැකිය. රේගු වාර්තා විග්‍රහ කර බැලීමේදී, සීමා කොට නොමැති භාණ්ඩ ගෙන්වීම, භාණ්ඩ සීමාව නිසා ඇතිවූ බලපෑම මකාහරිනායුරු වැඩිවී ඇතැයි, නිගමනය කට හැක්කේ නොවේ.

1962 දී පිටරටින් ගෙන්වූ භාණ්ඩ වල වටිනාකම, අඩුවූයේ මඳ වශයෙන් වුවද, ලංකාවේ ගෙවුම් ශේෂයෙහි සෑහෙන දියුණුවක් ඇතිවිය. 1961 වසරේදී ලංකාවේ ගෙවුම් ශේෂය රුපියල් කෝටි 3·0 ක සුළු අතිරික්තයක් දක්වීය. එහෙත් 1962 දී ලංකාවේ ගෙවුම් ශේෂය රුපියල් කෝටි 14·8 තෙක් දියුණු වීය. පිටරටින් ගෙන්වන භාණ්ඩ සීමාකොට, ඉතිරි කරගත් ප්‍රමාණයට වඩා වෙළෙඳ ශේෂයෙහි දියුණුවක් ඇතිවූයේ 1962 දී පිටරට පැටවුන භාණ්ඩ වල වටිනාකම වැඩිවීම නිසාය. 1961 දී රුපියල් කෝටි 173·3 ක් වූ පිටරට පැටවූ භා ණ්ඩ වල වටිනාකම, 1962 දී රුපියල් කෝටි 180·8 තෙක් වැඩිවිය. මෙය රුපියල් කෝටි 7·5 ක වැඩි වීමෙකි. මෙසේ පිටරට පටවන ලද භාණ්ඩවල වටිනාකම වැඩිවීමට, ප්‍රධානතම හේතුව වූයේ පැටවූ භාණ්ඩ ප්‍රමාණය වැඩි වීමය. පිටරට පැටවූ තේ ප්‍රමාණය, සියයට 6 කින් වැඩි විය. රබර් ප්‍රමාණය සියයට 13·7 කින් වැඩිවිය. පොල් නිෂ්පාදිත සියයට 12 කින් වැඩිවිය. රට පැටවූ භාණ්ඩ ප්‍රමාණය මෙසේ වැඩිවීමට හේතුවක් වූයේ නිෂ්පාදනය වැඩි වීමය. අනෙක් හේතුව වූයේ මෙතෙක් රැස්කර තුබූ තොග අඩුකොට ගැනීමය. මුළු අපනයන මිල දර්ශකය, පසුගිය වසරේ පැවැති මට්ටමින් සියයට 2·1 කින් මඳ වශයෙන් පහළ වැටී ඇත. තේ මිල දර්ශකය සියයට 3·2 කින් අඩුවිය. රබර් මිල දර්ශකය සියයට 1·0 කින් අඩු විය. එහෙත්, ප්‍රධාන පොල් නිෂ්පාදිත තුනෙහි මිල දර්ශකය, සුළු වශයෙන් සියයට 2·5 කින් වැඩි විය. කෙසේවුවද, 1962 දී අපනයන මිල දර්ශකයේ ඇතිවූ පහළ වැටීම, පසුගිය අවුරුද්දේ පහළ වැටීම තරම් තියුණු නොවීය. 1961 දී අපනයන මිල දර්ශකය, සියයට 8·7 කින් පමණ අඩුවිය. 1962 දී මුළු ආනයන දර්ශකය සියයට 5·9 කින් අඩුවීම නිසා ලංකාවේ වෙළෙඳ අනුපාතය සාමාන්‍ය වශයෙන් සියයට 4·3 කින් වැඩි විය.

1962 ආනයන හා අපනයන සම්බන්ධයෙන් ඉහත කැරුන විග්‍රහය, රේගු වාර්තාවල දක්වෙන සංඛ්‍යා අනුව සැකසී ඇති අතර, ප්‍රධාන වශයෙන්ම එය මෙරටට ගෙන් වූ භාණ්ඩ හා මෙරටින් යැවුන භාණ්ඩ සම්බන්ධයෙන් වෙයි. මෙරටට ගෙන්වන හා මෙරටින් යැවෙන භාණ්ඩ නිසා, රටේ ගෙවුම් ශේෂයෙහි සහ, විදේශීය වත්කම් කෙරෙහි ඇතිවන බලපෑම රැඳී පවත්නේ නියම වශයෙන් කැරෙන ගෙවීම් උඩය. මෙයට පෙරාතු වාර්ෂික වාර්තාවල දක්වා ඇති හේතුන් පරිදි, භාණ්ඩ ගනුදෙනුවෙහි හා මුදල් හුවමාරුවෙහි, සමානුරූපතාවක් ඇති වන්නේ නොවේ. රේගු වාර්තාවල සටහන් වී ඇති සංඛ්‍යා තොරතුරු ගෙවීම් සංඛ්‍යා තොරතුරු වලින් වෙනස් වෙයි. තවද, කාල වශයෙන් හා වර්ගකිරීම් වශයෙන් ද, මේ සංඛ්‍යා වෙනස් වෙයි. 1962 දී වෙළෙඳ සංඛ්‍යා තොරතුරු හා ගෙවීම් සංඛ්‍යා තොරතුරු වල වෙනස විශේෂයෙන්, මතුවී පෙනෙයි. 1962 වෙළෙඳ සංඛ්‍යා වලින්, මෙරටට ගෙන්වූ භාණ්ඩ ප්‍රමාණයෙහි අඩු වීමෙක් දක්වෙන අතර, ගෙවීම් සංඛ්‍යා තොරතුරු වලින්, ගෙන්වූ භාණ්ඩ සඳහා වැඩියෙන් ගෙවා ඇති බවක් දක්වේ. 11 වැනි කොටසේ ජාත්‍යන්තර ගනුදෙනු වල මූල් පිටුවේ දක්වා ඇති පරිදි, මේ වෙනසට, හේතුවී ඇත්තේ 1962 අවසාන හරියේ දී මුදල් ගෙවා ඇති ආහාර වර්ග, පමාවී පැමිණීමත්, රජයෙන් ගෙන්වන ලද ආහාර වර්ග සහ අනෙකුත් භාණ්ඩ, මෙරටට පැමිණීමෙන්, පසුවත් ඒ සටහන් කර ගැනීමේ පමාවත් විය හැකිය.

ආනයන හා අපනයන නිසා ලංකාවේ විදේශීය වත්කම් කෙරෙහි, කවර බලපෑමක් ඇතිවී තිබේ ද යන්න සමාලෝචනය කළ යුත්තේ ලැබී ඇති ගෙවීම් සංඛ්‍යා තොරතුරු අනුවය. ගෙවීම් සංඛ්‍යා තොරතුරු අනුව 1962 දී ලංකාවේ වෙළෙඳ භාණ්ඩ ගිණුමෙහි, රුපියල් කෝටි 13·28 ක හිඟයක් ඇතිවිය. 1961 දී රුපියල් කෝටි 8·64 ක හිඟයක් ඇති වූ අතර, 1960 දී ඇතිවූ හිඟය රුපියල් කෝටි 20·99 ක් විය. 1962 දී වෙළෙඳ භාණ්ඩ ගිණුමෙහි හිඟයක් ඇතිවූයේ, රට පැට වූ භාණ්ඩ වලින් ලද ආදයම රුපියල් කෝටි 5·81 කින් වැඩි වී තිබියදීත් ය. මෙයට හේතු වූයේ පිටරටින් ගෙන් වූ භාණ්ඩ සඳහා ගෙවූ ප්‍රමාණය රුපියල් කෝටි 10·45 කින් වැඩි වීමය. ගෙන්වූ භාණ්ඩාදිය සඳහා ගෙවීම් වැඩි වූයේ ප්‍රධාන වශයෙන් රජය විසින් ගෙන්වන ලද, ආහාර වර්ග සහ ප්‍රාග්ධන භාණ්ඩ නිසාය. 1962 දී ගෙන්වන ලද සහල් ප්‍රමාණයත් මිලත්, පසුගිය අවුරුදු වල දීට වඩා වැඩි විය. පෞද්ගලික අංශයේ ගෙන්වන ලද භාණ්ඩ සඳහා ගෙවීම් මදක් අඩු විය.

මෙසේ, 1962 දී ලංකාවේ වෙළෙඳ භාණ්ඩ ගිණුමේ හිඟය වැඩි වුවද, 1961 දී රුපියල් කෝටි 0·74 ක හිඟයක් පැවැති අදිසි ගිණුම් ශේෂය 1962 දී රුපියල් කෝටි 0·88 ක අතිරික්තයක් බවට පෙරළිණි. මෙයට ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ, ලංකාවේ ඇති විදේශ තානාපති කාර්යාල මගින් රට තුළ කරන ලද වියදම් වැඩිවීමත්, විදේශීය ගමන් සහ විවිධ ගෙවීම් අඩුවීමත්ය. ලංකාවේ විදේශීය සංචිත වලට පොළී වශයෙන් ලැබෙන ඉපැයීම් අඩු වූ නිසා ආයෝජන ආදායම් හිඟය මඳක් වැඩි විය. වෙළෙඳ භාණ්ඩ ගිණුමෙන් සහ අදිසි ගිණුමෙන් සමන්විත වන, ලංකාවේ වර්තන ගිණුමේ මුළු ශේෂයෙහි ඇති වූ හිඟය, 1962 දී රුපියල් කෝටි 12·40 ක් වූ අතර, 1961 දී රුපියල් කෝටි 9·38 ක් වී ඇත. 1960 දී මෙය, රුපියල් කෝටි 22·05 සහ 1959 දී රුපියල් කෝටි 20·80 ක් ව තිබිණි. ප්‍රාග්ධන අංශයේ පෞද්ගලික ප්‍රාග්ධන ගිණුමෙන්, 1961 දී රුපියල් කෝටි 0·61 ක් මෙරටට ඇදී ආවද 1962 දී රුපියල් කෝටි 0·6 ක් මෙරටින් පිටට ඇදී ගොස් ඇත. ආ–ගිය කෙටි කාලීන ප්‍රාග්ධන හැර අවක්‍ර ආයෝජන වලින් පිටරට ඇදී ගිය ප්‍රමාණය 1961 දී රුපියල් කෝටි 0·78 ක් වුවද, 1962 දී එය රුපියල් කෝටි 0·07 තෙක් අඩුවිය.

ලංකාවේ වර්තන ගිණුමෙහි සහ පෞද්ගලික ප්‍රාග්ධන ගිණුමෙහි ඇති වූ මුළු හිඟය, ලංකාවේ විදේශීය වත්කම් හා වගකීම් කෙරෙහි බලපා ඇති අයුරු සම්පිණ්ඩනය කොට පහත සටහනේ දක්වා ඇත.

සංඛ්‍යා සටහන I—2

## 1958-1962 සඳහා ගෙවුම් ශේෂය

රුපියල් දශ ලක්ෂ

| | 1958 | 1959 | 1960 | 1961 | 1962 තාවකාලිකයි |
|---|---|---|---|---|---|
| 1. වෙළෙඳ භාණ්ඩ | | | | | |
| අපනයන .. .. .. | 1624 | 1773 | 1796 | 1707 | 1765 |
| ආනයන .. .. .. | —1713 | —1958 | —2006 | —1794 | —1898 |
| වෙළෙඳ ශේෂය .. .. | — 89 | — 185 | — 210 | — 87 | — 133 |
| 2. සේවා .. .. .. | — 41 | — 11 | — 32 | — 18 | — 2 |
| 3. පරිත්‍යාග .. .. .. | — 23 | — 12 | + 22 | + 11 | + 11 |
| 4. වර්තන ගිණුම් ශෙෂය .. .. | — 153 | — 208 | — 220 | — 94 | — 124 |
| 5. පෞද්ගලික ප්‍රාග්ධනය .. .. | — 4 | + 2 | — 5 | + 6 | — 6 |
| මුදල් ලබා ගන්නා ක්‍රමය .. | | | | | |
| 6. රජයේ සහ බැංකු ප්‍රාග්ධනය (1) .. | | | | | |
| (i) විදේශීය වත්කම් වෙනස්වීම .. | + 129 | + 199 | + 193 | + 10 | + 28 |
| (ii) විදේශීය වගකීම් වල වෙනස්වීම (2) | + 44 | + 40 | + 3 | + 100 | + 88 |
| (iii) අනෙකුත් (3) .. .. | | — 36 | | — 2 | |
| 7. වැරදි හා මගහැරීම් .. .. | — 16 | + 1 | + 29 | — 19 | + 14 |

(1) ධන ලකුණෙන් වත්කම් අඩුවීම හෝ වගකීම් වැඩිවීම හෝ දක්වෙයි.

(2) II ඌ—3 සංඛ්‍යා සටහනේ දක්වෙන ණය බේරීම්; මුළු පියවුම් හිඟය

(3) මේ ශීර්ෂය යටතේ දක්වා ඇති සංඛ්‍යාවලට ජාත්‍යන්තර මුදල් මණ්ඩලය, ජාත්‍යන්තර ප්‍රතිසංස්කරණ හා සංවර්ධන බැංකුවට, ජාත්‍යන්තර සංවර්ධන සමාගමට, ලංකාවේ වැඩි කළ සලාකය වශයෙන් විදේශීය මුදලින් ගෙවුන ප්‍රමාණය දක්වේ.

1961 වර්ෂයේදී විදේශීය හිඟය පියවා ගැනීමේ ක්‍රමයෙහි ඇති වූ වෙනසෙක් 1961 වාර්ෂික වාර්තාවේ සඳහන් කරන ලදී. මේ ක්‍රමය වූයේ විදේශීය සංචිත අඩු කර ගන්නවා වෙනුවට විදේශීය වගකීම් වැඩි කර ගැනීමය. ඉහත සඳහන් සංඛ්‍යා සටහනින් දක්වෙන පරිදි, 1962 දී ද හිඟය පියවා ගෙන ඇත්තේ බොහෝ සෙයින් ම මෙයට සමාන ක්‍රමයකටය. 1962 දී ලංකාවේ විදේශීය වත්කම් රුපියල් කෝටි 2·78 කින් අඩු විය. මෙය 1961 දී වැටුණු ප්‍රමාණය වන රුපියල් කෝටි 0·96 ට වඩා තරමක් වැඩිය. අනෙක් අතට, ලංකාවේ විදේශීය වගකීම් රුපියල් කෝටි 8·19 කින් වැඩි විය. වගකීම් වැඩි කිරීමෙහිලා ගැනෙන ප්‍රධාන ශීර්ෂය වී ඇත්තේ, 1962 පෙබර වාරි මාසයේදී දෙ වැනි වරටත් ජාත්‍යන්තර මුදල් මණ්ඩලයෙන් ලබා ගත් රුපියල් කෝටි 5·38 ක විදේශීය විනිමය කොටස විය. මෙසේ මුදල් ලබා ගැනීම හෝ, අනෙකුත් වගකීම් තවත් වැඩි කිරීමක් හෝ නොවූයේ නම්, 1962 ලංකාවේ විදේශීය වත්කම් රුපියල් කෝටි 8·16 කින් අඩු විය හැකිව තිබිණි.

1962 අවසාන වන විට ලංකාවේ විදේශීය වත්කම් පැවැති තත්ත්වය කෙටියෙන් සඳහන් කිරීම වටනේය. 1962 දෙසැම්බර් 31 වැනි දින වන විට ලංකාවේ විදේශීය වත්කම් ප්‍රමාණය රුපියල් කෝටි 50·39 ක් විය. මෙය ඒ වසරේ ගෙන්වන ලද භාණ්ඩ හා සේවා සඳහා වැය වන ප්‍රමාණයෙන් සියයට 23·7 කි. මෙදින මහ බැංකුවේ ජාත්‍යන්තර සංචිතය ද රුපියල් කෝටි 15·21 ක් විය. මෙය ලංකාවේ මුළු විදේශීය වත්කම් වලින් සියයට 30·2 කි. 1961 දී ජාත්‍යන්තර සංචිතය රුපියල් කෝටි 18·47 ක් විය. 1962 පැවැති ප්‍රමාණය මෙයට වඩා රුපියල් කෝටි 3·26 කින් වැඩිය. ජාත්‍යන්තර සංචිතයේ ද්‍රවශීලතා හැඩ ගැසීමේ දී සාමාන්‍ය වෙනසෙක් දක්නට ලැබිණි. පිටරට මුදල් ශේෂ, භාණ්ඩාගාර බිල්පත් සහ වට්ටම් කළ බිල්පත් වලින් සමන්විතවන ද්‍රවශීල වත්කම් ප්‍රමාණය රුපියල් කෝටි 9·22 ක් හෙවත් මුළු ජාත්‍යන්තර සංචිතයෙන් සියයට 50·0 ක් විය. 1962 අවසාන වන විට, ද්‍රවශීල වත්කම් රුපියල් කෝටි 8·60 ක් හෙවත් මුළු ජාත්‍යන්තර සංචිතයේ සියයට 56·5 ක් වී තිබිණි. 1962 දී ජාත්‍යන්තර සංචිතයේ සැලකිය යුතු උච්චාවචනයක් ඇති විය. වෙළෙඳ බැංකු වැඩ වර්ජනය පැවැති අවුරුද්දේ මුල් මාසවල, ජාත්‍යන්තර සංචිතය වැඩි විය. වසරේ මැද හරියේ දී අඩු වූයේ වසර අවසාන වන විට නැවත යථා තත්ත්වයට පැමිණියේය.

1962 දී ලංකාවේ පිටරට වගකීම් රුපියල් කෝටි 47·39 ක් විය. 1961 දී මෙය රුපියල් කෝටි 39·20 ක් ව පැවැතිණි. ලංකාවේ විදේශීය සංචිත ආරක්ෂා කර ගැනීමේ අටියෙන් විදේශීය හිඟයන් පියවා ගැනීම සඳහා පිටරටින් වැඩියෙන් ණය ගත්තද, මේ ණය බේරීම ඇරඹුන විට අනාගතයේ දී ලංකාවේ ගෙවුම් ශේෂයට හා විදේශීය සංචිත වලට එහි බර ඉසිලීමට සිදුවන්නේය. ලංකාව විදේශවලින් ගෙන ඇති ණය, බේරීමට නියමව ඇති දිනයන් පරීක්ෂා කරන විට, මේ බර 1964 දී සිට දැනෙන්නට විය හැකි බව පැහැදිළි වෙයි.

ජාත්‍යන්තර මුදල් මණ්ඩලයෙන් ණයට ගනු ලැබූ රුපියල් කෝටි 10·76 අවුරුදු පහක කාලය තුළ දී ගෙවිය යුතුය. මේ අනුව 1961 දී ගත් ණය 1966 දී ගෙවා නිම කළ යුතුය. 1962 දී ගත් ණය 1967 දී ගෙවා නිම කළ යුතුය. මෙයට අමතරව, රුපියල් කෝටි 6·0 ක් සහ රුපියල් කෝටි 2·46 වශයෙන් ගෙන ඇති රන් පවුම් ණය දෙක, 1964 දී සහ 1965 දී ගෙවා නිම කළ යුතුය. මේ ණය දෙක ගෙවීම සඳහා නිදන් අරමුදලක් පිහිටුවා ඇත. රන් පවුම් ණය ගෙවීමට පිහිටුවා ඇති නිදන් අරමුදල පළ කොට ඇති විදේශීය වත්කම් සංඛ්‍යා වලට ඇතුළත් කර ඇති නිසා මේ ණය ගෙවීමේ දී විදේශීය වත්කම් තවත් අඩු කර ගැනීමට සිදු වෙයි.

පිටරටින් බඩු ගෙන්වීම ඉතා දැඩි ලෙස සීමා කළ ද, විදේශීය වත්කම් දිගටම අඩු වීමෙන් ද, විදේශීය වගකීම් තවත් වැඩි වීමෙන් ද, 1962 දී ලංකාවේ විදේශීය ශේෂ වල ස්ථිර තාවයක් ඇතිවී නොමැති බව පෙනේ. වර්තන ගිණුමේ ඇති වූ ගෙවුම් හිඟය, 1961 ට පෙරාතු අවුරුදු වල දී පමණටම වැඩි නොවුනද, 1961 දී ඇති වූ හිඟයට වඩා තරමක් වැඩි විය. ඉහත සඳහන් කළ පරිදි, 1962 දී ඇති කැරුණ සීමා කිරීම්වල සම්පූර්ණ බලපෑම එම වසරේ දී ඇති නොවුනා විය හැකිය. 1963 මුල් මාස කීපය සඳහා ලැබී ඇති සාක්ෂි අනුව පිටරට භාණ්ඩ සඳහා ගෙවීම් අඩු වී ඇති බවක් හෙළි වෙයි.

ප්‍රතිපත්තියක් වශයෙන් සලකන විට, මෙරටට ගෙන්වන භාණ්ඩ සලාක ක්‍රමයකට සීමා කිරීමෙන්, වර්තන ගිණුමේ ගෙවුම් ශේෂයෙහි බලාපොරොත්තු වන තත්ත්වයම ආරක්ෂා කර ගැනීම කළ නොහැක්කේ නොවේ. මෙය ද, අපනයන වල ඉපයීම් පමණට සීමා වෙයි. ආනයන දැඩි ලෙස සීමා කිරීමෙන්, යටත්පිරිසෙයින් එක්තරා කාල සීමාවක් තුළ වර්තන ගිණුම් හිඟය වලක්වා ගැනීමට හෝ එය වැඩි වන අතට හරවා ගැනීමට හෝ පිළිවන් වෙයි. එහෙත් මුදල් ප්‍රාසාරණය නිසා, ආර්ථික ක්‍රමයෙහි ඇති වන බලපෑම එයින් ම මැකී යතැයි කිව හැක්කේ නොවේ. අනෙක් අතට, භාණ්ඩ ගෙන්වීම් කෙලින් ම සීමා කොට, විදේශීය සංචිත ආරක්ෂාකර ගැනීමට උත්සාහ ගැනීමත් සමග මුදල් ප්‍රාසාරණයක් ද ඇති වුවහොත්, එහි බලපෑම විදේශීය ගිණුම් කෙරෙහි නොව, මෙරට මිළ මට්ටම කෙරෙහි දැනෙන්නට වන්නේය. මෙයින් රට තුළ උද්ධමනයක් ඇතිවීමෙන් රටෙහි මිල හා වියදම අධික විය හැකිය. දිගු කාලීන වශයෙන්

සලකන විට, මෙ වැනි හැඩ ගැස්මක් ඇති වුව හොත්, විදේශීය ගිණුම් ද ඉන් ආරක්ෂා කර ගත හැකි වන්නේ නොවේ. වියදම වැඩිවීමෙන් අපනයන අංශයේ නිපැයුම කෙරෙහි ඒ නරක ලෙස බලපෑ හැක්කේය. මේ නිසා අපනයන ආදයම ද අඩු වී යන්නේය.

භාණ්ඩ ගෙන්වීම සලාක ක්‍රමයට අඩු කරලීමේ දී ද එක්තරා සීමාවක් ඇත්තේය. සුඛෝපභෝගී හා අනවශ්‍ය භාණ්ඩ ගෙන්වීම සීමා කිරීමෙන් පසු තවදුරටත් භාණ්ඩ ගෙන්වීම සීමා කිරීමෙන් වැඩි ඉතිරි කිරීමක් ලබා ගත හැක්කේ නොවේ. මෙයට අමතරව, ආර්ථික වර්ධනය සඳහාද ප්‍රාග්ධන භාණ්ඩ සහ අමුද්‍රව්‍ය පිටරටින් ගෙන්වා ගැනීමට අවශ්‍ය වන්නේය. පිටරටින් ගෙන්වන භාණ්ඩ සලාක ක්‍රමයට සීමා කිරීම නිසා එම භාණ්ඩ සඳහා ආදේශක භාණ්ඩ රට තුළ නිපදවීමේ උනන්දුව වැඩි වේ. මේ සඳහා ද පිටරටින් යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ ගෙන්වා ගැනීමේ ඇවසියාව වැඩිවෙයි. භාණ්ඩ ගෙන්වීම මෙසේ සීමාකිරීම නිසා ඇතිවන භාණ්ඩ හිඟයත්, මිල ඉහළ යාමත් නිසා මේ සීමාවන් ලිහිල් කිරීමට එයින් ම බලපෑමක් ඇති විය හැකිය. මහජන පාරිභෝජනය සඳහා ගනු ලබන අර්ධ අවශ්‍ය භාණ්ඩ සම්බන්ධයෙන් මෙය විශේෂ වෙයි. ජීවන වියදම පොදු වශයෙන් වැඩි වී ගිය විට මෙ වැනි බලපෑම් දරා සිටිය හැකි වන්නේ ද නොවේ. මේ හැම සාධකයක් අනුව මුල් අවස්ථාවේ, භාණ්ඩ ගෙන්වීම ඉතා දැඩි ලෙස සීමා කළ හැක්කේ වුවද, මේ සීමා කිරීම් දිගු කාලයක් තිස්සේ පවත්වා ගෙන ගිය නොහැකි බව හෙළි වෙයි. භා ්ඩ සීමා කිරීමෙන් පසු, ඒ වෙනුවට මෙරට භාණ්ඩ නිපදවන පමණට මිස, සලාක වශයෙන් භා ්ඩ ගෙන්වීම සීමා කොට, එමගින් ලංකාවේ විදේශීය ගෙවුම් තත්ත්වය සෑමදම ස්ථාවරව තබා ගැනීමට හැකි වන්නේ නොවේ.

## (ආ) දේශීය මිල මට්ටම

මෙයට පළමු පැහැදිළි කළ පරිදි, අය වැය ලේඛනය නිසා උද්ගත වූ මුදල් ප්‍රාසාරණයත්, පිට රටින් බඩු ගෙන්වීම සලාක ක්‍රමයකට සීමා කිරීමත්, නිසා රටතුළ මිල අධිකයක් හෙවත්, මිල මට්ටම කෙරෙහි උද්ධමනාත්මක බලපෑමක් ඇතිවීමට ඉඩ ඇත. එහෙත්, බඩුමිල වැඩි –අඩු වන අයුරු පොදුවේ මැණීම සඳහා සතුටු දයක මිල දර්ශකයක් නොමැති නිසා, 1962 ලංකාවේ මිල මට්ටම, කෙරෙහි ඇති වූ බලපෑම නිශ්චය වශයෙන් දැන ගත හැක්කේ නොවේ. කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙන් මැණෙන්නේ, කොළඹ කම්කරු පංතියේ පාරිභෝජනයට වැටෙන භාණ්ඩ වල මිල පමණෙකි. මෙයට අඩංගු වන ශීර්ෂ සීමා සහිත වන අතර, මේ දර්ශකය සැකැසීමට ගනු ලබන බොහෝ භාණ්ඩ ආනයන සීමා වලට අසු නොවන, එසේම පාලන මිලකට හෝ ආධාර ක්‍රමයකට හෝ සැපයෙන්නේය.

1962 දී කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි ඇති වූයේ සාමාන්‍ය වැඩිවීමෙකි. 1961 දී 104·8 ක් වූ මුළු දර්ශකය 1962 දී 106·3 තෙක් වැඩි විය. (පාදය 1952=100) මේ අනුව අවුරුද්ද තුළ සියයට 1·4 ක වැඩිවීමෙක් පිළිබිඹු වෙයි. මේ දර්ශකයට ඇතුළත් වන, මෙරට නිපද වූ භාණ්ඩ මිල සියයට 1·4 කින් වැඩි විය. පිට රටින් ගෙන්වන භාණ්ඩ 2·2 කින් වැඩි විය. පිටරට පටවන භාණ්ඩ සියයට 4·5 කින් අඩු විය. එහෙත් මෙහි බරතැබීම සුළුය. සාමාන්‍ය ඒ ඒ වර්ග වල භාණ්ඩ මිලෙහි වැඩිවීමෙක් දර්ශකයෙන් දැක්විණි. ආහාර ශීර්ෂ සියයට 1·1 කින් ද, රෙදි පිළි සියයට 4·1 කින් ද, ඉන්ධන සියයට 1·1 කින් ද, විවිධ සියයට 1·7 කින් ද, වැඩි වී ඇත. 1954 සිටම ගෙවල් කුලී සම්බන්ධයෙන් වෙනසෙක් කර නැත.

ඉහත සඳහන් කැරුන හේතූන් නිසා වර්තමානයේ, පොදු මිල මට්ටමෙහි වැඩිවීම, මිල දර්ශකයේ අඩුවෙන් සටහන් විය හැකිය. බඩු ගෙන්වීම සලාක ක්‍රමයකට සීමා කිරීම හා අය වැය හිඟයන් නිසා ඇති වූ මුදල් ප්‍රාසාරණයට අමතරව, භාණ්ඩ වර්ග විශාල ගණනක් සඳහා තීරු බදු වැඩි කරන ලදී. තීරු බදු හා සලාක පනවා අවශ්‍ය භාණ්ඩ සීමා නොකිරීම ප්‍රතිපත්තියක් විය. එම නිසා මේ වර්ග වලට නො ගැනෙන භාණ්ඩ වල මිල බොහෝ සෙයින් වැඩි වූවා විය හැකිය. උද්ධමනාත්මක බලපෑමක් ඇති වූ විට, විශේෂයෙන් ශීර්ෂ බොහෝ ගණනක් අයත් වන විශේෂ වර්ග වල භාණ්ඩ මිල වැඩිවීමෙන් ආරක්ෂා කර ගැනීමට හැකි වන්නේ නොවේ. මේ වර්ග වල භාණ්ඩ වැඩි වැඩියෙන් සැපයුවද, ප්‍රවාහණය, බෙද හැරීම ආදී වියදම්

වැඩිවීම නිසා, සිල්ලර මිල කෙරෙහි ඒ බලපාන්නට වෙයි. මිල වැඩි වන සමයක වැටුප් වැඩිවීමෙන් ද මෙයට සමාන බලපෑමක් ඇති වෙයි. මේ හැමෙකෙකින් ම පිළිබිඹු වන්නේ උද්ධමනාත්මක හැඩ ගැස්මක පවත්නා ලකුණුය.

1962 දී නියම වශයෙන් ඇති වූ මිල ඉහළයාම කෙතරම් වුවද, මුදල් ප්‍රාසාරණයේ සම්පූර්ණ බලපෑම ඒ වසරේ අත් නො දක්කා විය හැකිය. ප්‍රථමයෙන් ම වර්තන ගිණුමේ ගෙවුම් ශේෂයෙහි රුපියල් කෝටි 12·4 ක හිඟයක් ඇතිවීමෙන්, ලංකාවට පිට රටින් ලැබුන ඉපැයීම් වලට වඩා පිටරටින් ගෙන් වූ භාණ්ඩාදියෙහි වටිනාකම වැඩි වී ඇති බව පෙනේ. මේ සඳහා විදේශීය වත්කම් අඩු කර ගැනීමට හෝ විදේශීය වගකීම් වැඩි කර ගැනීමට හෝ නො හැකි වීයේ නම්, මෙරටට ගෙන්වන භාණ්ඩ තවත් සීමා කිරීමට අවශ්‍ය විය හැකිව තුබුනේය. එසේ වූයේ නම්, මිල මට්ටම එපමණට ම තියුණු ලෙස වැඩි වෙයි. දෙවැනිව, සලාක ක්‍රමයකට අනුව, භාණ්ඩ ගෙන්වීම සීමා කිරීමට පෙරාතුව, ගෙන්වා ගත් බඩු තොග තුබූ නිසා භාණ්ඩ සඳහා වූ අධික ඉල්ලුම ඉන් පිරිමසා ගත හැකි විය. තෙ වැනිව, මෙරට නිෂ්පාදනය වැඩිවීම නිසා මුදල් ප්‍රාසාරණය තරමක් දුරට අඩු වුනා විය හැකිය. 1962 දී ලංකාවේ කෘෂිකාර්මික හා කාර්මික නිපැයුම වැඩි වී ඇත. ගෙන්වීම සීමා කැරුන සමහර භාණ්ඩ වෙනුවට මෙරට ආදේශක භාණ්ඩ නිපදවීම නිසා, භාණ්ඩ හිඟය තරමක් දුරට ඉන් පිරිමසා ගැනීමට ද හැකි විය. අවසාන වශයෙන් ආනයන (මි.ර.ගැ.) මිල ද තරමක් අඩුවිය. මුළු ආනයන මිල දර්ශකය, පසුගිය වසර හා සසඳන විට 1962 දී සියයට 5·9 කින් අඩු වී ඇත. පිට රටින් ගෙන්වන ආයෝජන භාණ්ඩ වල මිල දර්ශකය සියයට 17·9 කින් පමණ අඩු වූ අතර, අන්තර් භාණ්ඩ මිල දර්ශකය හා පාරිභෝගික භාණ්ඩ මිල දර්ශකය, සියයට 4·5 කින් හා 2·0 කින් අඩුවිය.

අනාගතයේදී ද මිල මට්ටම මේ සාධක නිසා ආරක්ෂා වෙතැයි බලාපොරොත්තු විය හැක්කේ නොවේ. පිටරට යවන භාණ්ඩ මිල වැඩි නොවුන හොත් විදේශීය වත්කම් අඩුවීම හා විදේශීය ණය ගැනීම් තවදුරටත් වැඩිවීම වලක්වා ගැනීම සඳහා 1962 කැරුන සීමා වලට දැඩි සීමා පනවා බඩු ගෙන්වීම තවත් අඩු කළ යුතු වෙයි. ඉහත සඳහන් කළ පරිදි, අවුරුද්ද තුළ බලපෑම සම්පූර්ණයෙන්ම ඇති නොවුන ද 1962 අවසාන භාගයේ දී බඩු ගෙන්වීම දැඩි ලෙස සීමා කරන ලදී. එසේම මුලදී ගෙන්වා ඇති බඩු තොග ද අඩු නොවී තිබෙන්නේ නොවේ. තොග අඩුවෙත්ම, ඇතිවන භාණ්ඩ හිඟය නිසා, මිල තවත් වැඩිවිය හැක්කේය, තවද, බඩු මිල වැඩි වෙතැයි යන බලාපොරොත්තුවෙන්, තිබෙන තොග සැඟවීම නිසාත්, බඩු මිල වැඩිවී යා හැකිය. මෙරටට ගෙන්වන භාණ්ඩ වල පිටරට මිල අඩු නොවුන විට, රටතුළ මතු වන උද්ධමනය මකා ගැනීම සඳහා ඇති එකායන මාර්ගය වන්නේ, මෙරට නිෂ්පාදනය වැඩිකර ලීමය. දේශීය නිෂ්පාදනය වැඩි වීමෙන් නො අනුමානවම පොදු මිල මට්ටම කෙරෙහි සහනදයක බලපෑමක් ඇති කළ හැකිය. එහෙත් මේ සමගම වැඩිවූ මුදල් ප්‍රාසාරණය, මේ මාර්ගයෙන් අඩුවී යතැයි බලාපොරොත්තුවීම, තත්වානුරූප නොවිය හැකිය. මෙයට පෙර දක්වුන පරිදි, විශාල ලෙස වැඩිවූ රජයේ අය වැය හිඟය, වැඩිවන වියදමත් සමග සම්බන්ධ වී පවත්නේය. මේ වැඩි වූ වියදමෙන් වැඩි කොටසක්, යෙදවී ඇත්තේ වර්තන වියදම් සඳහා මිස ප්‍රාග්ධන වියදම් සඳහා නොවේ. මුදල් සැපැයුම අධික ලෙස වැඩි කර ගැනීමෙන් ප්‍රාග්ධන සම්පාදනයට මුදල් යෙදුවද, මුදල් යෙදවීමේ සිට නිෂ්පාදනය දක්වා කාලයක් ගතවන නිසා එයින් ද මිල අධිකයක් ඇතිවිය හැකිය. මෙයට අමතරව, මෙසේ ආයෝජනය කිරීමෙන්, පාරිභෝගික භාණ්ඩ සඳහා වැය කළ හැකි විදේශීය විනිමය ද, මේ සඳහා වැය කිරීමට සිදු වෙයි. මේ බලපෑම් නිසා මෙරට නිෂ්පාදන වියදම වැඩිවී යාමෙන්, අලුතෙන් නිෂ්පාදනය කරන භාණ්ඩ වල ද මිල අධික වෙයි.

මුදල් ප්‍රාසාරණය අඩු කර ගැනීමේ ක්‍රියාමාර්ගයක් නොමැත්තේ, ලංකාවේ අර්ථ ක්‍රමයෙහි උද්ධමනයක් හෙවත් මිල අධිකයක් ඇතිවීමට ඉඩ ඇත්තේය. එවන්නක් කල් ඇතිව, වලක්වා නො ගත හොත්, ඒ කෙමෙන් දියුණුවෙමින් ගොස්, ප්‍රථමයෙන් ඇතිවන භාණ්ඩ මිල අධික වීමත් සමග වැටුප් හා මිල, ඒ අනුව වැඩිවෙයි. මේ මිල අධිකයේ බලපෑම සමාජයේ, ඒ ඒ ජන කොටස් කෙරෙහි, අසමාන අන්දමට බලපාන්නට වෙයි. මිල වැඩි වීමත් සමග, ආදායම වැඩි නොවන අයට මෙහි වැඩිම බර උසුලන්නට සිදුවෙත්. තවද උද්ධමනය නිසා සමපෙක්ෂිත කටයුතු වලින් ලැබෙන ලාභ ද වැඩි වන්නේය. එසේම භාණ්ඩ පිටරට යැවීම ප්‍රධාන කොට

ඇති අර්ථ ක්‍රමයක, ඇතිවන උද්ධමනය, ආර්ථික වර්ධනය කෙරෙහි ඉතා අහිතකර බලපෑමක් ඇති කරන්නේය. රට තුළ විකිණීම සඳහා භාණ්ඩ නිපදවන, මෙරට නිෂ්පාදකයා වැඩිවන පඩි සහ මිල, නිෂ්පාදන භාණ්ඩ මිලට එකතු කොට පාරිභෝගිකයා පිටම පටවනු ලබයි. එහෙත්, පිටරට වෙළෙඳ පොළට භාණ්ඩ නිපදවන්නාට එසේ කිරීමට පිළිවන් වන්නේ නොවේ. නිෂ්පාදන වියදම වැඩි වෙත්ම, පිටරට වෙළෙඳ පොළේ දී තරඟ කිරීමට ඇති හැකියාව දුබල වෙයි. එසේම මෙය ආන්තික නිෂ්පාදකයා ගේ නිපැයුම කෙරෙහි බලපාන නිසා අපනයන ආදායම ද අඩු වී යන්නේය. මෙය ගෙවුම් ශේෂය කෙරෙහි නරක බලපෑමක් ඇති කරනවා පමණක් නොව, ආයෝජන අතිරික්තය කෙරෙහි ද අවාසි ලෙස බල පාන්නේය. මේ හේතුවෙන් අර්ථ ක්‍රමයෙහි ඇති මූලා අසමතුලිත තාවය තවත් ශක්තිමත් වෙයි.

මුදල් ප්‍රාසාරණයත් සමග, සලාක ක්‍රමයකට, භාණ්ඩ සීමා කිරීම නිසා, ඇතිවන විපාකය මිල වැඩිවීම පමණක්ම නොවේ. එවැනි සීමා කිරීම් නිසා, ඇතිවන පමාවීම් සහ හිරවීම් නිසා ආර්ථික කටයුතු අවහිර වීමට ඉඩ තිබේ. ආනයන සඳහා කැරෙන මුළු වියදම අඩු කර ගැනීමට නම්, භාණ්ඩ සීමා කිරීමේ ක්‍රමයෙහි, පූර්ණත්වයක් ඇතිවිය යුත්තේය. මේ අනුව, සුබෝපභෝගි පාරිභෝගික භාණ්ඩ වල සිට භාණ්ඩ විශාල සංඛ්‍යාවක්, මේ සීමා කිරීමේ ක්‍රමයට යටත් කළ යුතුය. එසේම පාලන යන්ත්‍රය කෙතරම් කාර්යක්ෂම වුවත්, ආර්ථික කටයුතු අඩාල නොවී ගෙනයාමට හැකිවන සියලුම අවශ්‍යතා කල්තියා දැන ගැනීම අපහසු කරුණෙකි. තරමක නම්‍යතාවයකින් යුතු පාලන විධිවිධාන ඇති කිරීමෙන්, මේ දුෂ්කරතාවය තරමක් මග හරවා ගත නොහැක්කේ නොවේ. 1961 වාර්ෂික වාර්තාවේ සඳහන් කළ පරිදි ආනයන සීමා කිරීමේ අවියක් වශයෙන් ආනයන බලපත්‍ර වෙනුවට, ආනයන බදු පැනවීමෙන්, ආනයන සඳහා වැඩි නම්‍යතාවයක් ඇති කර ගැනීමට හැකිවෙයි. ආනයන බදු වැඩි කිරීමෙන් ද, භාණ්ඩ මිල වැඩි වෙයි. එහෙත්, එයින් උද්ධමනාත්මක බලපෑමක් ඇති නොවේ. සලාක ක්‍රමයට භාණ්ඩ ගෙන්වීම සීමා කිරීමෙන්, ඉල්ලුම් පමණට භාණ්ඩ නො මැති නිසා භාණ්ඩ මිල වැඩි වන්නේය. ආනයන බදු පැනවීම නිසා වැඩිවන මිලෙන් කොටසක් රජයට ලැබෙන අතර, එය මුළු හිඟය පියවා ගැනීමට උදව් වෙයි. සලාක නිසා වැඩිවන මිලේ වාසිය වෙළෙන්දට ලැබෙන අතර, මුදල් ආදයම තවත් වැඩිවීමට හේතු වෙයි. අය වැය ලේඛන හිඟය අඩු කිරීමෙහි ලා උපකාරී වන මිල වැඩිවීම උද්ධමනය වලක්වා ගැනීමෙහි ලා, යෙදවිය හැකි සීමා කිරීමෙහි අවියක් වශයෙන් වැඩි වැඩියෙන් වැඩට ගෙන ඇත. ආනයන සීමා කිරීම සඳහා කෙලින් ම ක්‍රියා කිරීමට අවශ්‍ය වී තිබෙන විට, මේ අවිය ක්‍රමාන්විතව වැඩට ගැනීමට තවමත් ඉඩ ඇත්තේය.

22762
15 JUN 2009

### (ඇ) මුදල් සැපැයුම හා වෙළෙඳ බැංකු ණය

අය වැය ලේඛනයෙන් ඇතිවන මුදල් ප්‍රාසාරණයත් සමග පිටරටින් ගෙන්වන භාණ්ඩ කෙළින්ම සීමා කිරීම නිසා, මුදල් සැපයුමෙහි සහ, වෙළෙඳ බැංකු ණය දීමෙහි වෙනස්කම් ඇති විය. භාණ්ඩ ගෙන්වීම සීමා කිරීමේ විධිවිධාන පැන වීමට පෙරාතුව, අය–වැය ලේඛනයෙන් ඇති වූ ප්‍රාසාරණාත්මක බලපෑම නිසා, ආනයන වියදම වැඩි වූ අතර, ගෙවුම් ශේෂ තත්ත්වය ද නරක අතට හැරිණි. මෙය වැඩිවන මුදල් සැපයුමද, වෙළෙඳ බැංකුවල වැඩිවන ද්‍රවශීලතාවය ද, සීමා කිරීමෙහි ලා එක්තරා, බලපෑමක් ද ඇති කළේය. එහෙත් පිටරටින් ගෙන්වන භාණ්ඩ ප්‍රමාණය, කෙලින්ම අඩු කර ගැනීමෙන් ගෙවුම් හිඟය මග හරවා ගැනීමට උත්සාහ දැරීම නිසා, මුදල් සැපයුමෙහි හා බැංකු ද්‍රවශීලතාවය සීමා කැරුන මේ බලපෑම අඩුවී ගියේය. මේ නිසා මුදල් සැපයුමත් බැංකු ද්‍රවශීලතාවත් වැඩිවීම නිසා අර්ථ ක්‍රමයේ ඇති ප්‍රාසාරණාත්මක බලපෑම තවත් ශක්තිමත් විය. 1962 දී මේ සාධක කෙතෙක් දුරට බලපා ඇත්තේ ද යන්න පහත එන විස්තරයෙන් විග්‍රහ කැරේ.

මුදල් සැපැයුම, නෝට්ටු හා කාසි වලින් ද මහජනයා සතු ඉල්ලුම් තැන්පතු වලින් ද සමන්විත වෙයි. 1961 දී ලංකාවේ මුළු මුදල් සැපැයුම, රුපියල් කෝටි 128·9 ක් විය. 1962 වන විට එය රුපියල් කෝටි 134·3 තෙක් රුපියල් කෝටි 5·4 කින් වැඩි විය. මුදල් සැපැයුමේ ඇතිවූ වෙනස හා වෙනසට හේතු අනෙක් පිටේ එන සංඛ්‍යා සටහනේ විග්‍රහ කැරේ :—

සංඛ්‍යා සටහන I—3

## මුදල් සැපයුමෙහි වෙනෙස (1961-62 කාලච්ඡේදය අවසානය)

රුපියල් දශ ලක්ෂ

| | | |
|---|---|---|
| **ප්‍රාසාරණාත්මක සාධක** | | |
| (අ) | රජය බැංකු වලින් ගත් ණය | 231·6 |
| (ආ) | වෙළෙඳ බැංකු වලින් පෞද්ගලික අංශයට දුන් ණය | 42·2 |
| | **එකතුව** | **273·8** |
| **සංකෝචන සාධක** | | |
| (අ) | බැංකුවල විදේශීය වත්කම් වෙනස්වීම | 91·1 |
| (ආ) | කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු වැඩිවීම | 50·9 |
| (ඇ) | රජයේ මුදල් ශේෂ | 76·1 |
| (ඈ) | ගැලපිලි | 1·7 |
| | **එකතුව** | 219·8 |
| **මුදල් සැපයුමේ වෙනස (ශුද්ධ)** | | + 54·0 |

ඉහත දැක්වෙන පරිදි 1962 දී මුදල් සැපැයුම වැඩිවීමට ප්‍රධානතම හේතුව වී ඇත්තේ, අය–වැය හිඟය පියවා ගැනීමට, රජය විසින් බැංකු වලින් ණය ගැනීම බව පෙනේ. එහෙත් බැංකු වල ණය වැඩිවූ පමණට මුදල් සැපැයුම වැඩිවී නැත. මෙයට හේතු වූයේ, දිගටම පැවැති විදේශීය ගෙවුම් හිඟය නිසා බැංකුවල විදේශීය වත්කම් අඩුවීමත්, කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු සහ රජයේ මුදල් ශේෂ වැඩිවීමත් ය. මුදල් සැපැයුම අඩු කරලන මේ සාධක නොවන්නට, 1962 මුදල් සැපැයුම ඉතා වැඩි විය හැකිව තිබිණි.

මුදල් සැපැයුම වැඩිවූයේ මහජනයා සතු නෝට්ටු හා කාසි ද, ඉල්ලුම් තැන්පතු ද, වැඩි වීමෙනි. මුදල් සැපැයුමට අඩංගුවන නෝට්ටු හා කාසි ප්‍රමාණය, 1961 දී රුපියල් කෝටි 69·22 ක් වූයේ, 1962 වන විට, රුපියල් කෝටි 71·26 තෙක් වැඩි විය. සම කාලය තුළ මහජනයා සතු ඉල්ලුම් තැන්පතු ද, රුපියල් කෝටි 59·64 සිට රුපියල් කෝටි 63·0 තෙක් වැඩි වී ඇත. මුළු මුදල් සැපැයුමට, නෝට්ටු හා කාසි වල ඇති, සියයට ගණන 1961 දී සියයට 53·8 ක් වූයේ 1962 දී සියයට 53·1 තෙක් මඳක් අඩුවිය. එහෙත් බැංකු තැන්පතු අනුව බලන කල නෝට්ටු හා කාසි කොටස ප්‍රමාණවාචකව වැඩි වී ඇත. නැවත වරක් රු. 100/– හා රු. 50/– නෝට්ටු නිකුත් කිරීම වැඩි වී ඇත. මෙය ලොකු ගනු–දෙනු සඳහා නෝට්ටු හා කාසි භාවිතා කරන බවත්, වත්කම් ද්‍රවශීලව තබා ගන්නා බවත්, හඟවන ලකුණෙකි.

වෙළෙඳ බැංකු වලින් රජයට හෝ මහජනයාට හෝ දෙන ලද ණය, වලින්, මුදල් සැපැයුම වැඩි කිරීමෙහි ලා, සැලකිය යුතු බලපෑමක් පෙරදී ඇති නොවිණි. එහෙත් අලුත්, හැඩගැස්ම අනුව, බැංකුවල ද්‍රවශීලතාවය, පුළුල්වීම නිසා වෙළෙඳ බැංකුවල, ණය මවා දීමේ ශක්තිය වැඩි වීමෙන්, අර්ථ ක්‍රමයේ ඇති උද්ධමනාත්මක බලපෑම තවත් උග්‍ර විය හැකිය. මේ අනුව තෝරාගත් විධිවිධාන අනුව බැංකු ණය සීමා කිරීම මුළු මුදල් ප්‍රතිපත්තියේ අත්‍යාවශ්‍ය අංගයක් විය යුත්තේය.

අතැති මුදල්, මහ බැංකුවේ තැන්පතු, විදේශීය ශේෂ, භාණ්ඩාගාර බිල්පත්, සහ වට්ටම් කළ බිල්පත්, වලින් සමන්විත වන වෙළෙඳ බැංකුවල මුළු ද්‍රවශීල වත්කම් ප්‍රමාණය, 1957 දී සහ 1958 දී වේගයෙන් අඩුවී ගියද, ඊට පසුව නැවත වැඩිවිය. මාසික සංඛ්‍යා සාමාන්‍යයේ පදනම අනුව බැලීමේ දී, 1958, රුපියල් කෝටි 30·1 තෙක් අඩු වූ මුළු ද්‍රවශීල වත්කම් ප්‍රමාණය, 1962 වන විට ක්‍රමයෙන් රුපියල් කෝටි 46·6 තෙක් වැඩි විය. අවසාන අවුරුද්දේ වැඩිවීම පමණක් රුපියල් කෝටි 9·1 ක් විය. වෙළෙඳ බැංකුවලින් රජයට හා පෞද්ගලික අංශයට ණයදීම කෙරෙහි මේ හැඩ ගැස්ම බොහෝ සෙයින් බලපා ඇත.

වෙළෙඳ බැංකු වලින් පෞද්ගලික අංශයට දෙන ලද ණය සම්පිණ්ඩනය කොට පහත එන සංඛ්‍යා සටහනේ දක්වා ඇත.

සංඛ්‍යා සටහන I—4

## වෙළෙඳ බැංකු වලින් පෞද්ගලික අංශයට දුන් ණය

(මාසික සංඛ්‍යා සාමාන්‍ය)

රුපියල් දශ ලක්ෂ

| | 1960 | පසුගිය වසරට වඩා වූ වැඩිවීම | 1961 | පසුගිය වසරට වඩා වූ වැඩිවීම | 1962 | පසුගිය වසරට වඩා වූ වැඩිවීම |
|---|---|---|---|---|---|---|
| වට්ටම් කළ බිල්පත් .. .. .. | 115 | — 4 | 132 | + 7 | 136 | +14 |
| ණය හා අයිරාවන් .. .. .. | 430 | +35 | 435 | + 5 | 478 | +43 |
| පෞද්ගලික අංශයට දෙන ලද මුළු දේශීය ණය .. | 545 | +31 | 557 | +12 | 614 | +57 |

ඉහත දක්වෙන පරිදි, 1962 මාසික සංඛ්‍යා සාමාන්‍ය අනුව, පෞද්ගලික අංශයට වෙළෙඳ බැංකු විසින් දී ඇති ණය රුපියල් කෝටි 5·7 කින් වැඩිවී ඇත. මෙය 1961 දී ඇතිවූ සමානුරූප වැඩීමට අධික වුවද, අය–වැය ලේඛන හිඟය නිසා ඇතිවූ මුදල් ප්‍රසාරණය හා සසඳන විට, දෙවැනි තැනට වැටේ.

1962 දී ඇතිවූ එක්තරා හැඩගැස්මක් වූයේ, වෙළෙඳ බැංකු වලින් රජයට දෙන ලද ණය වැඩිවීමය. 1961 ට පෙරාතු වසර වලදී රජයේ ණය වලට වෙළෙඳ බැංකු සැලකිය යුතු අන්දමින් දායක වුනේ නොවේ. එහෙත් 1961 දී රජයේ ණය වලට වෙළෙඳ බැංකු වලින් දෙන ලද ණය රුපියල් කෝටි 2·7 කින් වැඩිවිය. මෙයට බොහෝ සෙයින් හේතුවූයේ භාණ්ඩාගාරය බිල්පත් මිලට ගැනීමය. 1962 දී මෙය තවත් වැඩිවිය. වෙළෙඳ බැංකු භාණ්ඩාගාර බිල්පත් වල සහ රජයේ හා රජය ඇප වූ සුරැකුම් පත්වල යෙදවූ ප්‍රමාණය රුපියල් කෝටි 5·1 කින් වැඩිවිය. නැවතත් වෙළෙඳ බැංකු ණය ප්‍රධාන වශයෙන්ම භාණ්ඩාගාර බිල්පත් වලින් සමන්විත විය. 1962 දී බැංකු සතු බිල්පත් රුපියල් කෝටි 3·8 කින් වැඩිවිය. ඉහත කී පරිදි බැංකුවල ද්‍රවශීල තාවයෙහි ඇතිවූ දියුණුව මෙයින් පිළිබිඹු වෙයි.

රටේ ගෙවුම් ශේෂ තත්ත්වය නිසාත්, බැංකුවල වෙනස්වී ගිය ද්‍රවශීල තාවය නිසාත්, බැංකු ණය ප්‍රමාණය හා ක්‍රමය, පාලනය කිරීම සඳහා, මූල්‍ය විධිවිධාන කිහිපයක් පැනවීම අවශ්‍ය විය. එවැනි විධිවිධාන මාලාවක්ම 1960 සිට මහ බැංකුව විසින් පනවන ලදී. මෙයින් සමහරක්, පිට රටින් බඩු ගෙන්වීම සඳහා දෙන බැංකු ණය ප්‍රමාණය අඩු කිරීම සඳහා විය. අනෙක් විධි විධාන අවස්ථාවේ හැටියට එතරම් වැදගත් නැති කරුණු සඳහා දෙන බැංකු ණය සීමා කිරීම සඳහා යෙදවිණි. මේ අනුව 1960 අගෝස්තු මාසයේදී, තෝරාගත් ආනයන සීමා කිරීම සඳහා ණයවර ලිපිවලට අවශ්‍ය මුදල් ප්‍රමාණය නියම කරන ලදී. එසේම කුලී පිට ගැනුම් සඳහා, මුදල් සැපයීම ද සීමා කරන ලදී. මේ සමගම මහ බැංකු ණය සඳහා පොළිය ද සියයට 2 සිට සියයට 4 දක්වා වැඩි කැරිණි. 1961 පෙබරවාරි මාසයේදී නියමිත ප්‍රමාණයකට ඉල්ලුම් තැන්පතු සඳහා සියයට 50 සංචිත අනුපාතයක් පනවන ලදී. නැවත 1961 ඔක්තෝබර් මාසයේදී බඩු පිටරට යවන සමාගම් වලට හැර, අනෙකුත් විදේශීය සමාගම් වලට දෙන අයිරා පහසුකම්, තුනෙන් එකකින් අඩු කිරීමට විනිමය පාලනයට අවශ්‍ය විය. විදේශීන් අයත් වූ හෝ නොවූ වතු මිලයට ගැනීම සඳහා වෙළෙඳ බැංකු වලින් දෙන ණය මිලයට ගන්නා මුදලින් සියයට $33\frac{1}{3}$ ක වැඩි නොවිය යුතු යැයි 1962 දෙසැම්බර් මාසයේදී මහ බැංකුවෙන් නියෝග කැරිණි. බහිවාසිකයන්ගේ නිශ්චල දේපල මිලයට ගැනීම සඳහා දෙන ණය වෙනුවෙන් ද මේ සීමා නියෝගය බලපවත්වයි.

පෞද්ගලික අංශයට දෙන බැංකු ණය, ප්‍රමාණයත්, ක්‍රමයත්, මිලත් කෙරෙහි මේ විධිවිධාන බල පා ඇත. උදහරණයක් වශයෙන්, 1961 දී වැඩි වෙමින් තුබුණ පොළී ප්‍රමාණය ගැන එම වර්ෂයේ වාර්ෂික වාර්තාවේ සඳහන් කැරිණි. 1962 දී පොළී ප්‍රමාණය මඳ වශයෙන් වැඩි වන අතට හැරිණි. පෞද්ගලික අංශයට ණය දුන් ක්‍රමයෙහි ඇති වූයේ මඳ වෙනසෙකි. වෙළෙඳ බැංකු වලින් දුන් මුළු ණය ප්‍රමාණය වැඩි වුවද, මහ බැංකුවෙන් කරන ලද සමීක්ෂණයට අනුව 1961 සැප්තැම්බරයේ සිට 1962 ජූනි දක්වා කුලී පිට ගැනුම් වැනි මූල්‍ය කටයුතු සඳහා ද දෙන ලද ණය අඩු වී ඇති බව හෙළි වෙයි. එහෙත් කෘෂිකාර්මික හා කාර්මික ණය මදක් වැඩි වී ඇත. එසේ ම පාරිභෝජනය හා අනෙකුත් කටයුතු සඳහා දී ඇති ණය ද වැඩි වී ඇත.

මෙයට පෙර වාර්තාවල සඳහන් කර ඇති පරිදි අය–වැය හිඟය නිසා ඇති වන උද්ධමනාත් මක බලපෑම අඩුකරලීමට මුදල් ප්‍රතිපත්තියට ඇති හැකියාව ඉතාමත් සීමා සහිතය. බැංකු ණය දෙ වැනි වරටත් වැඩි නොවී සීමා කර ගැනීමත්, එසේ ම එම ණය නිෂ්පාදන හා අනෙකුත් අවශ්‍ය කටයුතු සඳහා යෙදවීමට සැලසීමත් මේ අනුව මුදල් ප්‍රතිපත්ති මාර්ගයෙන් කළ හැකි අතර, එය ද, රජය විසින් ගනු ලබන ප්‍රතිකාරක ක්‍රියාවලට පරිපූරික වශයෙන් කළයුත්තේ යි. එහෙත් රජය මුදල් පරිහරණය නිසා උද්ගත වන ප්‍රාසාරණාත්මක බලපෑම දිගටම පැවැතීමට ඉඩහලහොත් මේ විධිවිධානයන් ගෙන් ඇති වන බලපෑමද සීමා සහිත වෙයි. එම නිසා ලංකාවේ මුදල් ප්‍රශ්නයට මූලික පිළියම සෙවිය යුත්තේ රජයේ මුදල් පරිහරණයෙන් මය.

## (4) නිගමනය

ඉහත කොටස් වලින් කැරුන සාකච්ඡාවෙන්, මුදල් හා මූල්‍ය අංශයේ ක්‍රියාකාරි වෙමින් තිබෙන බලවේගයන් කිහිපයක් ගැන සඳහන් කරන ලදි. මූල්‍ය අසමතුලිත තාවය, ඇතිකිරීමෙහි ලා බලපාන මූලික සාධකය වන, අය–වැය ලේඛන හිඟය පියවීමට, ප්‍රාසාරණාත්මක මාර්ගයන් ගෙන් මුදල් සෙවීමේ කිසි වෙනසෙක් නොකැරුනේ 1962 දී ද එලෙසම තිබිණි. මේ තත්ත්වය නිසා, රටේ විදේශීය ශේෂ සහ මෙරට මිල මට්ටම කෙරෙහි ඇති විය හැකි විපාක ද විග්‍රහ කර ඇත්තේය. සලාක ක්‍රමයට ආනයන සීමා කිරීමත් සමග, ලංකාවේ ආර්ථික ක්‍රමය වෙනස් තත්ත්වයකට මුහුණ පෑ හැකි බවත් පෙන්වා දී ඇත. මුදල් ප්‍රාසාරණය, පිටරට ගිණුම් කෙරෙහි බලනොපා දේශීය මිල මට්ටම කෙරෙහි බලපාන්නට වෙයි. මෙය වලක්වා නොගත හොත්, මෙහි ගැබ්වී ඇති අවදානම් තත්ත්වය ගැන ද, අවධාරණයෙන්ම කියා පැහැදිලි කොට ඇත. උද්ධමනය, වේගවත්ව නැඟී ගියහොත් එය වලක්වා ගැනීම වඩාත් දුෂ්කර වෙයි. අධික උද්ධම නයකට ගොදුරු වූ බොහෝ රටවල් ස්ථායිකරණය සඳහා ඊටපසු ගනු ලබන ක්‍රියා මාර්ගය විශාල බලපෑමක් ඇති කරවන, පීඩාකාරී එකක් බව අත් දැකීමෙන් දන්නේය. ලංකාවේ උද්ධම නාත්මක හැඩ ගැස්ම, වෙනත් පෙදෙස් වල සමහර කාල වල දී ඇති වූ පමණට තවම උග්‍ර අවස්ථාවකට එළඹ නැත. එහෙත්, එවැනි උද්ධමන අවස්ථාවකට, මුල පුරා තිබෙන බව පැහැදිලිය. එමනිසා එය වලක්වා ගැනීමට ප්‍රමාණවත් වූ ක්‍රියා මාර්ගයක් කල් නොඉක්මවා ගැනීමට අවශ්‍ය වී ඇත.

ලංකාවට වහාම අවශ්‍ය ව ඇත්තේ රටේ සංවර්ධනය වේගයෙන් වැඩි දියුණු කර ගැනීමයි. රජය බදු මාර්ගයෙන් සෑහෙන මුදල් ප්‍රමාණයක් ලබා ගනී. එසේම ඊට අමතරව ප්‍රාසාරණාත්මක ක්‍රමයට ද මුදල් ලබා ගනී. එහෙත්, නොපමාව වේගයෙන් කළ යුතුව ඇති සංවර්ධන ය සඳහා රටේ ප්‍රාග්ධන සම්පාදනය තවමත් ප්‍රමාණවත්ව වැඩිවී නොමැත. නොපමාවම වේගයෙන් කළ යුතුව ඇති ලංකාවේ ජාතික නිෂ්පාදනය, මූර්ත වශයෙන් වැඩි වෙමින් තුබුන ද, ජනගහනයේ වැඩිවීම හා සලකන විට, එය වැඩිවී ඇත්තේ ඉතා සුළු වශයෙනි. මෙයට අමතරව, රැකීරක්ෂා ඉල්ලා සිටින ජනතාවගේ අවශ්‍යතා පමණට රැකීරක්ෂා වල වැඩිවීමෙක් ද, ඇති වූ බවක් නො පෙනේ. එහෙත් සමහර ආර්ථික අංශවල වර්ධනය දිරිදනවන සුළුය. උදහරණයක් වශයෙන් තේ නිපැයුම වසර ගණනක සිටම වැඩි වෙමින් පවතී. එසේම මෙරට නිපදවන වී සහ අනෙකුත් බෝග ද වැඩිවී ඇත. මේ වර්ධන අනාගතයේ දී ද එලෙසම පවත්වාගෙන යාම අත්‍යාවශ්‍යය. අර්ථ ක්‍රමයෙහි දිගු කාලීන සැලැස්ම ගැන සලකන විට, නො අනුමානවම තවත් වැදගත් වෙනස් වීමක් සිදුවී ඇත. මෙය, මෑත දී වැඩි වී ගිය කාර්මික කටයුතු හා සම්බන්ධ වෙයි.

මෑත දී ලංකාවේ ඇතිවූ කාර්මික සංවර්ධනය පිළිබඳ, මේ වාර්තාවේ ඉදිරි කොටසක සඳහන් වේ. මේ සම්බන්ධව, නියත වශයෙන් සංඛ්‍යා තොරතුරු නොමැති වුවද, මෙරට කාර්මික සංවර්ධන කටයුතුවල උනන්දුව වැඩි වී ඇති බවට සාක්ෂි තිබේ. ජාතික නිෂ්පාදිතයට මෙරට කර්මාන්ත වලින් ලැබෙන කොටස තවමත් සුළුය. බොහෝ කර්මාන්ත තවමත් ගොඩනගා ගෙන යන අවස්ථාවෙහි පවතී. කෙසේ වුවද, සමහරක් දැනටමත් ආරම්භ කොට ඇත. කාර්මික දියුණුවෙහි ලා මේ ඉතා වැදගත් වන්නේය. ගෙවුම් ශේෂය ආරක්ෂා කර ගැනීම සඳහා පිට රටින් බඩු ගෙන්වීම සලාක ක්‍රමයට සීමා කිරීමෙන්, මෙරට කාර්මික නිෂ්පාදනයෙහි විශාල උද්යෝගයක් ඇති කළේය. මෙසේ සීමා කරන භාණ්ඩ මෙරට නිපදවීමට හැකි නම්, මෙරට කර්මාන්ත සඳහා ඇති උද්‍යෝගය වැඩිවීම භාණ්ඩ සීමා කිරීමෙන් ලැබිය හැකි සතුටුදයක ප්‍රතිඵලයකි. එසේම අනාගත කාර්මික නිෂ්පාදන පදනම ශක්තිමත්ව පිහිටුවා ගැනීම ඉතා වැදගත් වෙයි. ගෙවුම් ශේෂ අවශ්‍යතා සඳහා ආනයන සීමා කිරීම් පැනවීමට තුඩු දුන් හේතුන්ම දේශීය කර්මාන්ත පටන් ගැනීමේ හේතු වශයෙන් ගැනීමට අවශ්‍ය වන්නේ නොවේ. ආනයන සීමා කිරීමෙන් මෙරට කර්මාන්තයනට ආරක්ෂාවක් සැලසෙන්නේය. එහෙත් එවැනි සීමා කිරීම්වල බර, වැඩි වශයෙන්ම එතරම් අවශ්‍ය නොවූ පාරිභෝගික භාණ්ඩ මත පැටවෙන්නේය. මේ අංශවල දේශීය නිෂ්පාදනයන් ඇරැඹීමට හැකියාවක් තිබිය හැකිය. එහෙත්, අනාගත ලංකාවේ කාර්මික හැඩ ගැස්ම මේ සාධක වලින්ම තීරණය කළ යුතු නොවේ. එමනිසා ලංකාවට අවශ්‍ය කාර්මික සැකැස්මක් පිළියෙළ කර ගැනීමේ ප්‍රශ්නය කාර්මික සැලසුම් හා ප්‍රතිපත්තිය අනුව විසඳිය යුතුය. ලංකාවේ කාර්මික හැඩ ගැස්මේ දී දිගු කාලීන පැවැත්මක් ඇති කර්මාන්ත වලට සැලකිල්ලක් දැක්වීම ඉතා වැදගත් වන්නේය.